# 4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

## 4.1 සමස්ත නිරීක්ෂණ

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන, කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2006/07 = 100) වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2014 වසර තුළ දී තනි ඉලක්කමක මට්ටමෙහි පැවතිණි.** 2014 වසර අවසානය වන විට, ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය පිළිවෙළින් සියයට 2.1 ක් සහ සියයට 3.3 ක් වශයෙන් වාර්තා විය. විචක්ෂණශීලී මුදල් කළමනාකරණය, ජාත්‍යන්තර වෙළඳ පොළේ භාණ්ඩ මිල ගණන් පහළ යෑම, සාපේක්ෂ ලෙස ස්ථාවරව පැවති විනිමය අනුපාතිකය, සැපයුම් පාර්ශ්වයෙහි අවහිරතා පාලනය කිරීම සඳහා ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ උද්ධමන අපේක්ෂා හොඳින් පාලනය කිරීම යන කරුණුවල සමස්ත ප්‍රතිඵලයක් වශයෙන්, 2014 වසර තුළ දී උද්ධමන පීඩනය අඩු මට්ටමක පැවතිණි. එයට අමතරව වසරේ මුල් මාසවල දී නැවුම් ආහාර වර්ගවල දේශීය සැපයුම ඉහළ යෑම සහ විදුලිය හා ජල ගාස්තු, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් හා එල්.පී. ගෑස්වල පරිපාලිත මිල ගණන් අඩුවන පරිදි සිදුකළ සංශෝධන, පොදු මිල මට්ටම පහත හෙළීමට සහ උද්ධමනය අඩු මට්ටමක පවත්වාගෙන යෑමට දායක විය. මේ අතර උද්ධමනයෙහි දිගුකාලීන යටිදැරි උපනතිය පිළිබිඹු කරන මූලික උද්ධමනය අඩු විචලතාවක් සහිතව පහළ මට්ටමක පැවතිණි. වසර තුළ උද්ධමනය අඩු මට්ටමක පැවතීම සියලුම අංශවල සේවකයන්ගේ මූර්ත වැටුප් ඉහළ නැංවීමට උපකාරී විය. මේ සමගම වසර තුළ සිදු වූ නාමික වැටුප්වල ඉහළ යෑම ද මූර්ත වැටුප් ඉහළ යෑම සඳහා ඉවහල් විය. 2014 වසරේ දී ආර්ථික කටයුතු පුළුල් වීම මගින් ආර්ථිකයට වැඩි ශ්‍රමිකයන් පිරිසක් අවශෝෂණය කිරීමට ඇති හැකියාව වැඩි දියුණු විය. ආර්ථික කටයුතු පුළුල් වීම හේතුවෙන් ශ්‍රම බලකාය වර්ධනය වීමට වඩා වැඩි වේගයකින් රැකියා අවස්ථා උත්පාදනය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත සේවා වියුක්ති අනුපාතිකයෙහි පහළ යෑමක් සිදු විය. කෙසේ වුවද, ශ්‍රම බලකායට වඩා වැඩි ප්‍රමාණයකින් සේවයෙහි යෙදිය හැකි වයසේ ජනගහනය ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සුළු වශයෙන් පහළ ගියේය. කෘෂි කර්මාන්ත අංශය සේවා නියුක්තික සංඛ්‍යාව සඳහා දැක්වූ දායකත්වය 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී අඩු වූ අතර කර්මාන්ත සහ සේවා අංශවල දායකත්වය ඉහළ ගියේය. සේවා අංශය ආර්ථිකයෙහි විශාලතම රැකියා උත්පාදනය කිරීමේ අංශය ලෙස අඛණ්ඩව සිය ප්‍රමුඛතාව පවත්වා ගනු ලැබීය. 2014 වසරේදී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඉහළ ගියේය. තවද, ආකර්ෂණීය වේතන හේතුවෙන්, දේශීය වෙළඳ පොළෙහි රැකියා අවස්ථා තිබිය දී වුවද විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් යොමුවීම හේතුවෙන් දේශීය ශ්‍රම වෙළඳ පොළේ ශ්‍රම හිඟයක් දැකිය හැකි විය. 2014 වසරේ දී විදේශ රැකියා නියුක්තිය සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව අඛණ්ඩව ඉහළ ගියේය. පුරුෂ සංක්‍රමණිකයන්ගේ වැඩිවීම මෙම ඉහළ යෑම සඳහා මුළුමනින්ම හේතු වූ අතර එමගින් ගෘහසේවිකාවන් ලෙස පිටත්ව යෑම් අඩු කිරීම සඳහා අදාළ අධිකාරීන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල සාර්ථක භාවය ද පිළිබිඹු කෙරේ. වෘත්තීමය, මධ්‍යම මට්ටම, ලිපිකරු ආශ්‍රිත රැකියා සහ අර්ධ පුහුණු කාණ්ඩයන්හි ශ්‍රම සංක්‍රමණවල ඉහළ යෑමක් වසර තුළ දී සිදු විය. මේ අතර, ආර්ථිකයෙහි ප්‍රධාන අංශ තුනෙහිම ශ්‍රම ඵලදායිතාව අඛණ්ඩව ඉහළ ගියේය.


## 4.2 මිල

### මිල විචලන සහ ඒ සඳහා දායක වූ සාධක

#### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)

**ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල විචලන මිනුම් කරනු ලබන නිල මිල දර්ශකය වන කො.පා.මි. දර්ශකය (2006/07=100), 2014 වසරේ දී මධ්‍යස්ථ වේගයකින් ඉහළ ගියේය.** ඒ අනුව, 2014 ජනවාරි මාසයේ දී සියයට 6.5 ක්ව පැවති වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය නොකඩවා පහළ යමින් 2014 දෙසැම්බර් වන විට සියයට 3.3 ක් කරා ළඟා විය. ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය වසර තුළ දී මිශ්‍ර විචලනයක් පෙන්නුම් කළ ද සමස්තයක් ලෙස පහළ ගියේය. එය ජනවාරි මාසයේ සිට පෙබරවාරි මාසය දක්වා පහළ ගොස් මාර්තු මාසයේ දී එම මට්ටමෙහිම ස්ථාවරව පැවති අතර, ඍතුමය ඉල්ලුම මෙන්ම පදනම් බලපෑම හේතුවෙන් 2014 අප්‍රේල් මාසයේ දී නැවත ඉහළ ගියේය. ලක්ෂ්‍යමය උද්ධමනය, 2013 වසරේ මැයි සහ ජූනි මාසවල දී වාර්තා කළ ඉහළ පදනම හේතුකොට ගෙන 2014 වසරේ අනුරූප මාසවල දී සැලකිය යුතු පහළ යෑම් වාර්තා කළේය. ප්‍රධාන කෘෂි නිෂ්පාදන ප්‍රදේශවලට බලපෑ අයහපත් කාලගුණික තත්ත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සැපයුම පහළ යෑම හේතුකොට ගෙන කෘෂි නිෂ්පාදනවල මිල ගණන් ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 ජූලි මාසයේ දී ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය ඉහළ ගියේය. කෙසේ වුවද, යල කන්නයේ අස්වනු වෙළඳ පොළට පැමිණීමත් සමග මිල ගණන් පහළ යෑමත්, ඉන්ධන සහ විදුලිය ගාස්තු සංශෝධනය කිරීමත් හේතුවෙන් ඔක්තෝබර් මාසයේ දී උද්ධමනය පහළ ගියේය. ඉන්ධන මිල ගණන් සහ ජල ගාස්තු තවදුරටත් පහළ දැමීමත් සමග ලක්ෂ්‍යමය උද්ධමනයේ පහළ යෑමේ උපනතිය තවදුරටත් අඛණ්ඩව පවත්වා ගනිමින් වසරේ අවම ලක්ෂ්‍යමය උද්ධමන අගය වූ සියයට 1.5, 2014 නොවැම්බර් මාසයේ දී වාර්තා විය. අධික වර්ෂාව හේතුවෙන් සිදු වූ වගා හානි සහ ප්‍රවාහනයට සිදු වූ බාධා හේතුකොටගෙන 2014 දෙසැම්බර් මස වන විට එය සියයට 2.1 ක් දක්වා ඉහළ ගියේය.

**4.1 රූප සටහන** **කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2006/07=100)**




#### ආහාර කාණ්ඩයේ මිල විචලන

**ලක්ෂ්‍යමය ආහාර උද්ධමනය වසර තුළ දී සමස්තයක් වශයෙන් ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කළේය.** ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය ජනවාරි මස දී සියයට 1.3 ක් වූ අතර, පළමු කාර්තුව තුළ දී අඩු මට්ටමක පැවතිණි. කෙසේ වුවද, එය ඉන්පසුව මිශ්‍ර විචලන දක්වමින්, සැලකිය යුතු ලෙස ඉහළ ගොස් 2014 දෙසැම්බර් මස වන විට සියයට 7.0 ක් කරා ළඟා විය. ආහාර කාණ්ඩයෙහි වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය සමස්තයක් වශයෙන් පහළ යෑමේ නැඹුරුවක් පෙන්වූ අතර 2014 ජනවාරි මස වාර්තා වූ සියයට 7.1 හි සිට දෙසැම්බර් මාසයේ දී සියයට 3.8 කරා ළඟා විය.

**ආහාර කාණ්ඩය තුළ ප්‍රධාන අයිතමයක් වන සහල්වල, බරතැබූ සාමාන්‍ය මිල 2014 වසර තුළ දී 2013 වසරට වඩා ඉහළ මට්ටමක පැවතිණි.** යල සහ මහ කන්න දෙකෙහිම පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් එම කන්න දෙකෙහිම වී නිෂ්පාදනය පහළ වැටීම මෙම මිල ඉහළ යෑමට හේතු විය. මීට පෙර වගා කන්න කිහිපයකදීම ලද අස්වනු නියමිත සාමාන්‍ය මට්ටමක නොතිබීම හේතුවෙන් ඇති වූ සහල් තොග හිඟය මෙම මිල ඉහළ යෑම තවදුරටත් තීව්‍ර කිරීමට හේතු විය. තවද, සහල් ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන් සහල් මිල දී ගැනීම සඳහා ඇති වූ තරගකාරීත්වය ද සහල් මිල කෙරෙහි යම් පීඩනයක් ඇති කිරීමට හේතු විය. දේශීය වෙළඳ පොළෙහි සැපයුම් සීමාවලට පිළියම් යොදමින් මිල පීඩනය යම් තරමකට සමනය කිරීම සඳහා 2014 අප්‍රේල් මස 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයනික සහල් වර්ග මත පනවා තිබූ සියලු බදු වෙනුවට කිලෝ ග්‍රෑමයකට රු.5 ක විශේෂ භාණ්ඩ බද්දක් හඳුන්වා දෙමින් සහල් ආනයන මත පනවා තිබූ බදු අඩු කරන ලදී. 2014 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි එය කිලෝ ග්‍රෑමයකට රු. 1 දක්වා තවදුරටත් පහළ දමන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සහල් ආනයන ඉහළ යෑම සැපයුම් හිඟය අවම කිරීම සඳහා ආයක විය. මීට අමතරව, වෙළඳ පොළ මිලට වඩා ඉතා පහළ මට්ටමක පැවති සහල්වල උපරිම මිල සීමාව ද 2014 අප්‍රේල් මස 09 වැනි දින සිට ඉහළ නංවන ලදී. තවද, 2014 අප්‍රේල් මස 27 දින සිට ලක් සතොස වෙළඳ සල්වල ආනයනික සහල්වල උපරිම සිල්ලර මිල පහළ දමන ලදී. සහල් මිල තරමක් දුරට පාලනය කර ගැනීමට මෙම ක්‍රියාමාර්ග උපකාරී විය.

**4.1 සංඛ්‍යා සටහන**

**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකය (වසර අග) | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 (අ) | 2013 දෙසැ./ 2012 දෙසැ. | 2014 දෙසැ./ 2013 දෙසැ. (අ) | 2013/2012 | 2014/2013 (අ) |
| කො.පා.මි.ද. (2006/07=100) | 176.5 | 180.2 | 4.7 | 2.1 | 6.9 | 3.3 |
| ද.දේ.නි. අවධමනකය (2002=100) | 265.6 | 279.0 | - | - | 6.7 | 5.1 |

(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**පෙර වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී එළවළුවල බරතැබූ සාමාන්‍ය මිල සුළු වශයෙන් පහළ ගියේය.** සැපයුම් තත්ත්වයෙහි සිදු වූ වර්ධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 මුල් මාස කිහිපයේ දී බොහොමයක් එළවළු වර්ගවල මිල ගණන් සාපේක්ෂව අඩු මට්ටමක පැවතිණි. කෙසේ වුවද, සැපයුම් තත්ත්වයෙහි සිදු වූ පහළ යෑම හේතුවෙන් සමස්ත මිල, මැයි මාසයේ සිට ඉහළ යෑම ඇරඹුණු අතර, සමස්ත උද්ධමනය කෙරෙහි එමගින් යම් පීඩනයක් ඇති විය. එසේ වුවද, යල කන්නයේ අස්වනු වෙළඳ පොළට ළඟාවීමත් සමග, 2014 අගෝස්තු මස සිට එළවළු මිල ගණන් පහළ යෑම ඇරඹිණි. එනමුත්, ඍතුමය සාධක සහ අයහපත් කාලගුණික තත්ත්වයෙහි සමස්ත ප්‍රතිඵලයක් වශයෙන්, ඔක්තෝබර් මස සිට නැවතත් මිල ගණන් ඉහළ යෑම ඇරඹිණි.

**2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී නැවුම් මත්ස්‍ය හා මුහුදු ආහාරවල බරතැබූ සාමාන්‍ය මිල ගණන් සියයට 2.5 කින් ඉහළ ගියේය.** සාමාන්‍ය ඍතුමය රටාව අනුව යමින්, 2014 ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා කුඩා සහ විශාල යන මත්ස්‍ය දෙවර්ගයෙහිම මිල ගණන් අඩු මට්ටමක පැවතිණි. එහෙත් මුහුදුබඩ ප්‍රදේශවලට බලපෑ අහිතකර ඍතුමය කාලගුණික තත්ත්ව හේතු කොටගෙන එම මිල ගණන් ක්‍රමයෙන් ඉහළ ගියේය. අන්තර් මෝසම් ධීවර සමයේ දී සැපයුම වර්ධනය වීම හේතුවෙන් ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල දී මිල ගණන් පහළ ගියේය. කෙසේ වුවද, 2014 දෙසැම්බර් මාසයේ දී ඍතුමය ඉල්ලුම හේතුවෙන් මිල ගණන් ඉහළ ගියේය. මේ අතර, බිත්තර සඳහා වූ අඩු ඉල්ලුම හේතුවෙන් 2014 වසරේ දී බිත්තර මිල සියයට 9.3 කින් පහළ ගියේය.

**2014 වසරේ පොල් නිෂ්පාදනය ඉහළ මට්ටමක පැවතුණ ද, පොල් සැකසුම් කර්මාන්ත වෙතින් පොල් සඳහා වූ ඉල්ලුම ඉතා ඉහළ මට්ටමක පැවතීම ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන, 2014 ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා පොල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතිණි.** කෙසේ වුවද, එතැන් සිට මිල ගණන් ක්‍රමයෙන් පහළ ගිය අතර වසර අවසානය වන විට නැවත ඉහළ ගියේය. මේ අතර පොල්තෙල් මිල ගණන් 2014 ජූලි මස දක්වා 2013 දෙසැම්බර් මස වාර්තා වූ මට්ටමෙහිම පැවැති අතර ඉන් අනතුරුව අඩු විය. මෙම මිල විචලනවල සමස්ත ප්‍රතිඵලයක් වශයෙන් පෙර වසර හා සැසඳීමේ දී 2014 වසරේ පොල් සහ පොල්තෙල්වල සාමාන්‍ය මිල ගණන් පිළිවෙළින් සියයට 8.1 කින් සහ සියයට 9.7 කින් ඉහළ ගියේය.

**4.2 සංඛ්‍යා සටහන**

**උප කාණ්ඩ අනුව වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සඳහා දායකත්වය (අ)**

| දර්ශකය | 2013 ප්‍රතිශතය | | 2014 ප්‍රතිශතය | |
|---|---|---|---|---|
| | වෙනස | දායකත්වය | වෙනස | දායකත්වය |
| **කො.පා.මි.ද. (සියලුම ශීර්ෂ)** | **6.9** | **100.0** | **3.3** | **100.0** |
| **ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග** | **7.9** | **52.0** | **3.8** | **53.1** |
| **ආහාර නොවන** | **6.1** | **48.0** | **2.8** | **46.9** |
| රෙදිපිළි හා පාවහන් | 5.4 | 2.4 | 0.4 | 0.4 |
| නිවාස, ජලය, විදුලි, ගෑස් හා වෙනත් ඉන්ධන | 10.7 | 30.8 | 1.1 | 7.1 |
| ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තුව | 4.0 | 1.8 | 2.3 | 2.1 |
| සෞඛ්‍ය | 1.7 | 1.2 | 8.5 | 11.9 |
| ප්‍රවාහන | 4.6 | 9.1 | 4.5 | 18.6 |
| සන්නිවේදන | 0.0 | 0.0 | 4.0 | 3.0 |
| විනෝදාත්මක හා සංස්කෘතික | 4.1 | 0.8 | 2.2 | 0.9 |
| අධ්‍යාපන | 0.9 | 0.5 | 0.5 | 0.5 |
| විවිධ භාණ්ඩ හා සේවා | 4.2 | 1.5 | 3.2 | 2.3 |

(අ) කො.පා.මි.ද. (2006/07=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.3 සංඛ්‍යා සටහන**

**ආනයනික සහ දේශීයව නිෂ්පාදිත ප්‍රධාන අයිතමවල සිල්ලර මිල ගණන්**

| අයිතමය | ඒකකය | කො.පා.මි.ද. (2006/07=100) බර තැබීම් (%) | මිල රුපියල් – වාර්ෂික සාමාන්‍යය 2012 | වාර්ෂික සාමාන්‍යය 2013 | වාර්ෂික සාමාන්‍යය 2014 | 2012 දෙසැ. | 2013 දෙසැ. | 2014 දෙසැ. | ප්‍රතිශත වෙනස – වාර්ෂික සාමාන්‍යය 2013/2012 | වාර්ෂික සාමාන්‍යය 2014/2013 | ලක්ෂ්‍යමය 2013 දෙසැ./2012 දෙසැ. | ලක්ෂ්‍යමය 2014 දෙසැ./2013 දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දේශීය | | | | | | | | | | | | |
| සම්බා සහල් | කි.ග්‍රෑ.1ක් | 1.96 | 70.15 | 72.29 | 84.14 | 74.06 | 72.21 | 92.77 | 3.1 | 16.4 | -2.5 | 28.5 |
| රතු කැකුළු සහල් | කි.ග්‍රෑ.1ක් | 0.85 | 57.08 | 59.87 | 75.28 | 60.58 | 60.78 | 91.90 | 4.9 | 25.7 | 0.3 | 51.2 |
| සුදු කැකුළු සහල් | කි.ග්‍රෑ.1ක් | 0.60 | 56.26 | 59.28 | 71.75 | 60.46 | 60.44 | 78.19 | 5.4 | 21.0 | 0.0 | 29.4 |
| නාඩු සහල් | කි.ග්‍රෑ.1ක් | 0.35 | 59.67 | 61.59 | 78.37 | 62.73 | 63.31 | 87.56 | 3.2 | 27.3 | 0.9 | 38.3 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | ගෙඩියක් | 1.84 | 34.76 | 43.44 | 45.63 | 38.22 | 47.64 | 47.04 | 25.0 | 5.0 | 24.7 | -1.3 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ.1ක් | 1.11 | 694.14 | 697.33 | 741.22 | 718.18 | 694.60 | 744.35 | 0.5 | 6.3 | -3.3 | 7.2 |
| බෝංචි | කි.ග්‍රෑ.1ක් | 0.43 | 157.60 | 166.00 | 163.87 | 160.65 | 166.16 | 207.49 | 5.3 | -1.3 | 3.4 | 24.9 |
| වම්බටු | කි.ග්‍රෑ.1ක් | 0.19 | 99.25 | 107.73 | 110.34 | 113.28 | 92.58 | 137.20 | 8.5 | 2.4 | -18.3 | 48.2 |
| බිත්තර | එකක් | 0.37 | 11.29 | 14.06 | 12.75 | 14.49 | 14.12 | 12.78 | 24.5 | -9.3 | -2.5 | -9.5 |
| ආනයනික | | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ.1ක් | 1.12 | 101.04 | 100.95 | 101.71 | 105.50 | 102.41 | 100.37 | -0.1 | 0.7 | -2.9 | -9.5 |
| කිරිපිටි - ඇන්කර් | ග්‍රෑ.400ක් | 3.21 | 302.35 | 325.00 | 379.13 | 325.00 | 325.00 | 386.00 | 7.5 | 16.7 | 0.0 | 18.8 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ.1ක් | 0.73 | 145.07 | 156.34 | 162.80 | 146.18 | 157.05 | 170.34 | 7.8 | 4.1 | 7.4 | 8.5 |
| තිරිඟු පිටි | කි.ග්‍රෑ.1ක් | 0.20 | 90.92 | 98.13 | 97.80 | 98.46 | 97.93 | 97.84 | 7.9 | -0.3 | -0.5 | -0.1 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සැපයුම් පාර්ශ්වයේ අවහිරතා දක්නට ලැබුණු අවස්ථාවල දී ඒවා සමනය කිරීමට මෙන්ම සමහර අවස්ථාවල දී දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කෙරිණි. ඒ අනුව, දේශීය අස්වනු නෙළන කාලවල දී ආනයන අධෛර්යවත් කිරීම සඳහා අර්තාපල්, ලොකු ළූණු සහ රතුළූණු වැනි ආනයනික භාණ්ඩ මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, වසර තුළ දී කිහිප වතාවක් ඉහළ නංවන ලදී. තවද, 2014 සැප්තැම්බර් මාසයේ දී අර්තාපල් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී අර්තාපල්වල සාමාන්‍ය මිල ගණන් සියයට 11.3 කින් ඉහළ ගිය අතර, ලොකුළූණු සහ රතුළූණු මිල ගණන් පිළිවෙළින් සියයට 19.9 කින් සහ සියයට 35.4 කින් පහළ ගියේය.

රට තුළ ආහාර සුරක්ෂිතතාව වර්ධනය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් නැවුම් ආහාර සැපයුම වර්ධනය වීම සහ නිෂ්පාදන හා බෙදාහැරීමේ ක්‍රියාවලිය සඳහා උතුරු හා නැගෙනහිර පළාත් ද ඇතුළත් කර ගැනීම, පසුගිය වසර කිහිපයේ දී නැවුම් ආහාර මිල ගණන් පහළ යෑම සඳහා උපකාරී විය. කෙසේ වුවද, නිෂ්පාදක සහ පාරිභෝගික මිල මට්ටම් අතර පවතින පරතරය අවම කිරීම සඳහා බෙදාහැරීමේ ක්‍රම සහ ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කළ යුතු බව සඳහන් කළ යුතුය. තවද, වැඩි අස්වනු සහිත භෝග වර්ග හඳුන්වාදීම ද නැවුම් ආහාර මිල ගණන් තවදුරටත් පහළ හෙළීමට දායක වනු ඇත.

2014 වසර තුළ දී ආනයනික ආහාර අයිතම බොහොමයක පාහේ දේශීය මිල ගැළපීම්, ජාත්‍යන්තර වෙළඳ පොළේ එම අයිතමවල මිල විචලනයට සමගාමීව සිදුවිය. ආනයනික ආහාර අයිතම අතුරෙන්, 2014 වසර තුළ දී පරිප්පු සහ සීනි මිල ගණන් පෙර වසරට සාපේක්ෂව පිළිවෙළින් සියයට 4.1 කින් සහ සියයට 0.7 කින් ඉහළ ගියේය. 2014 පෙබරවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ආනයනික කිරිපිටි ග්‍රෑම් 400 ක පැකට්ටුවක මිල රු.61 කින් සහ කිලෝ ග්‍රෑමයක මිල රු.152 කින් ඉහළ නංවන ලදී. කෙසේ වුවද, දේශීයව නිෂ්පාදිත කිරිපිටි පරිභෝජනය දිරිගැන්වීමේ අරමුණ සහිතව 2014 ඔක්තෝබර් මස අයවැය මගින් දේශීයව නිෂ්පාදිත කිරිපිටි කිලෝ ග්‍රෑමයක මිල රු.100 කින් පහත හෙළන ලදී. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවති විනිමය අනුපාතිකය ද ආනයනික භාණ්ඩවල මිල ගණන් පහළ මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය.

### ආහාර නොවන කාණ්ඩයේ මිල විචලන

කො.පා.මි.ද. භාණ්ඩ පැසෙන් සියයට 58.97 ක් වන ආහාර නොවන කාණ්ඩයෙහි උද්ධමනය වසර තුළ දී සමස්ත වශයෙන් පහළ යන උපනතියක් පෙන්නුම් කළේය. 2014 ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා ආහාර නොවන උද්ධමනය, ආහාර උද්ධමනයට වඩා ඉහළ අගයක් ගත් අතර, එය සමස්ත ලක්ෂ්‍යමය උද්ධමනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ඉන් පසුව, සමස්ත උද්ධමනය සඳහා මෙම කාණ්ඩයේ

දායකත්වය ශීඝ්‍රයෙන් අඩු විය. 2014 ඔක්තෝබර් මස සිට දෙසැම්බර් මස දක්වා ආහාර නොවන කාණ්ඩය සෘණ දායකත්වයක් දැක්වූ අතර ආහාර කාණ්ඩයෙන් ඇති කළ පීඩනය, යම් තරමකට සමනය කිරීම සඳහා එය ඉවහල් වූ බව සඳහන් කළ යුතුය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය, 2014 ජනවාරි මස වාර්තා වූ සියයට 7.1 හි සිට 2014 දෙසැම්බර් මස වන විට සියයට -2.0 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටිණි. ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය ද 2014 ජනවාරි මස වාර්තා වූ සියයට 5.9 හි සිට 2014 දෙසැම්බර් මාසයේ දී සියයට 2.8 දක්වා පහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තුව; සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; සහ විවිධ භාණ්ඩ හා සේවා

**4.4 සංඛ්‍යා සටහන**

**පරිපාලිත මිල සංශෝධන (2012-2014)**

| අයිතමය | | ඒකකය | මිල (වසර අවසානයේ දී) රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | 2012 | 2013 | 2014 | 2013/2012 | 2014/2013 |
| ඩීසල් - ලං. ඛ. නි. සං | | ලී. 1ක් | 115.00 | 121.00 | 111.00 | 5.2 | -8.3 |
| ඩීසල් - ලං. ඉ. තෙ. සං. | | ලී. 1ක් | 121.00 | 121.00 | 111.00 | 0.0 | -8.3 |
| භූමිතෙල් | | ලී. 1ක් | 106.00 | 106.00 | 81.00 | 0.0 | -23.6 |
| පෙට්‍රල් | | ලී. 1ක් | 159.00 | 162.00 | 150.00 | 1.9 | -7.4 |
| ගෑස් - ලිට්‍රෝ | | කි.ග්‍රෑ. 12.5 | 2,246.00 | 2,396.00 | 1,896.00 | 6.7 | -20.9 |
| ගෑස් - ලාෆ් | | කි.ග්‍රෑ. 12.5 | 2,246.00 | 2,396.00 | 1,896.00 | 6.7 | -20.9 |
| දැව්තෙල් (1500) | | ලී. 1ක් | 90.00 | 90.00 | 90.00 | 0.0 | 0.0 |
| දැව්තෙල් (3500) | | ලී. 1ක් | 90.00 | 90.00 | 90.00 | 0.0 | 0.0 |
| විදුලිය ගාස්තු - ස්ථාවර | ඒකක පරාසය | 0-30 | 30.00 | 30.00 | 30.00 | 0.0 | 0.0 |
| | | 31-60 | 60.00 | 60.00 | 60.00 | 0.0 | 0.0 |
| | | 61-90 | 90.00 | 90.00 | 90.00 | 0.0 | 0.0 |
| | | 91-180 | 315.00 | 315.00 | 480.00 | 0.0 | 52.4 |
| | | 180 ට වැඩි | 315.00 | 420.00 | 540.00 | 33.3 | 28.6 |
| විදුලිය ගාස්තු - ඒකක (අ) | ඒකක පරාසය | | | | | | |
| | 60 ට අඩු | 0-30 | 3.00 | 3.00 | 2.50 | 0.0 | -16.7 |
| | | 31-60 | 4.70 | 4.70 | 4.85 | 0.0 | 3.2 |
| | 60 ට වැඩි | 0-60 | - | 10.00 | 7.85 | - | -21.5 |
| | | 61-90 | 7.50 | 12.00 | 10.00 | 60.0 | -16.7 |
| | | 91-120 | 21.00 | 26.50 | 27.75 | 26.2 | 4.7 |
| | | 121-180 | 24.00 | 30.50 | 32.00 | 27.1 | 4.9 |
| | | 180 ට වැඩි | 36.00 | 42.00 | 45.00 | 16.7 | 7.1 |
| විදුලිය ගාස්තු - ඉන්ධන ගැලපුම් (අ) | ඒකක පරාසය | 0-30 | - | - | - | 25.0 | - |
| | | 31-60 | - | - | - | 35.0 | - |
| | | 61-90 | - | - | - | 10.0 | - |
| | | 90 ට වැඩි | - | - | - | 40.0 | - |
| ජල ගාස්තු - ඒකක (ආ) | ඒකක පරාසය | 0-5 | 8.00 | 8.00 | 8.00 | 0.0 | 0.0 |
| | | 6-10 | 11.00 | 11.00 | 11.00 | 0.0 | 0.0 |
| | | 11-15 | 20.00 | 20.00 | 20.00 | 0.0 | 0.0 |
| | | 16-20 | 40.00 | 40.00 | 40.00 | 0.0 | 0.0 |
| | | 21-25 | 58.00 | 58.00 | 58.00 | 0.0 | 0.0 |
| | | 26-30 | 88.00 | 88.00 | 88.00 | 0.0 | 0.0 |
| | | 31-40 | 105.00 | 105.00 | 105.00 | 0.0 | 0.0 |
| | | 41-50 | 120.00 | 120.00 | 120.00 | 0.0 | 0.0 |
| | | 51-75 | 130.00 | 130.00 | 130.00 | 0.0 | 0.0 |
| | | 75 ට වැඩි | 140.00 | 140.00 | 140.00 | 0.0 | 0.0 |
| බස් ගාස්තු | | | | | | 7.0 | - |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2012.02.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාසික විදුලිය ගාස්තුවට පමණක් අදාළ වන ඉන්ධන ගැලපුම් ගාස්තුව නැවත පනවන ලදි. 2013.04.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිය සඳහා වූ ස්ථාවර ගාස්තු, ඒකක ගාස්තු සහ ඉන්ධන ගැලපුම් ගාස්තුව ඉහළ දමන ලදී. 2014.09.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිය සඳහා වූ ස්ථාවර ගාස්තු සහ ඒකක ගාස්තු පහළ දමන ලද අතර ඉන්ධන ගැලපුම් ගාස්තුව ඉවත් කරන ලදී.

(ආ) 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකක 25 ට වඩා අඩු පරිභෝජනයක් සහිත ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ ජල බිල්පතෙහි වටිනාකමෙන් සියයට 10 ක අඩු කිරීමක් ලබා දෙන ලදී.

යන උප කාණ්ඩවලට අයත් අයිතමවල මිල ගණන් වසර තුළ දී සුළු වශයෙන් ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර එය උද්ධමනය කෙරෙහි ආන්තික බලපෑමක් ඇති කළේය.

**ආහාර නොවන පරිපාලිත අයිතමවල මිල ගණන් 2014 අගෝස්තු මස වන තුරු නොවෙනස්ව පැවති අතර, ඉන්පසුව සැලකිය යුතු ලෙස පහළ ගියේය.** කෙසේ වුවද, 2013 අප්‍රේල් මාසයේ දී විදුලිය ගාස්තු ඉහළ නංවමින් සිදුකළ සංශෝධනය හේතුවෙන් 2014 ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි ආහාර නොවන පරිපාලිත අයිතමවල දායකත්වය සැලකිය යුතු ලෙස ඉහළ නැගිණි. ලක්ෂ්‍යමය උද්ධමනය ගණනය කිරීම සඳහා ගැනෙන පදනම, 2014 මැයි මස දී ඉහළ නැගුණු අතර, 2014 ඔක්තෝබර් මාසය දක්වා එම මට්ටමෙහිම පැවතිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි මෙම අයිතමවල දායකත්වය 2014 මැයි මස දී දැඩි ලෙස පහත වැටුණු අතර, 2014 අගෝස්තු මස වනතෙක් අඩු මට්ටමක පැවතිණි. මුළු විදුලිය ගාස්තුව සියයට 25 කින් පමණ පහළ යන පරිදි, 2014 සැප්තැම්බර් මස සිට විදුලිය ගාස්තු මත වූ ඉන්ධන ගැලපුම් ගාස්තුව ඉවත් කරන ලද අතර, ඒකක ගාස්තු ද සංශෝධනය කරන ලදී. එම කාලපරිච්ඡේදයේ දී ඉන්ධන මිල ද පහත දමන ලදී. මෙම මිල සංශෝධනවල ආංශික බලපෑම 2014 සැප්තැම්බර් මස දී උද්ධමන පීඩනය අඩු කිරීමට තරමක් දුරට දායක විය. ඉහත මිල සංශෝධනවල සමස්ත බලපෑම සහ 2014 ඔක්තෝබර් මස දී එල්.පී.ගෑස් මිල අඩු කිරීම, 2014 ඔක්තෝබර් මස සිට ලක්ෂ්‍යමය උද්ධමනය සැලකිය යුතු ලෙස පහළ දැමීමට දායක විය. 2014 නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා කාලය තුළ දී, ඉන්ධන හා එල්.පී. ගෑස් මිල තවදුරටත් පහළ දැමීම සහ ඒකක 25 ට වඩා අඩු පරිභෝජනයක් සහිත ජල බිල්පත්වලට වටිනාකමෙන් සියයට 10 ක අඩු කිරීමක් ලබා දීම, උද්ධමන පීඩනය පහත හෙළීමට බොහෝ සෙයින් දායක විය.

**ජාත්‍යන්තර වෙළඳ පොළෙහි බලශක්ති මිල ගණන් පහළ යෑමේ වාසිය පාරිභෝගිකයන්හට ලබාදීම සඳහා, 2014 වසර තුළ අවස්ථා කිහිපයක දී ම ඉන්ධන මිල ගණන් පහළ දැමීමට මිල සංශෝධන සිදුකරන ලදී.** මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, කි.ග්‍රෑ. 12.5 ක් බරැති ගෘහස්ථ එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල ද අවස්ථා කිහිපයක දී ම පහළ දමන ලද අතර, එය 2013 වසර අවසානයේ සිට 2014 වසර අවසානය දක්වා සියයට 20.9 කින් මිල පහළ වැටීමට හේතු විය. 2013 වසර අවසානයේ සිට 2014 වසර අවසානය වන විට, පෙට්‍රල් සහ ඩීසල් ලීටරයක මිල පිළිවෙළින් සියයට 7.4 කින් සහ සියයට 8.3 කින් පහළ දමන ලදී. ඉන්ධන මිල ගණන් පහළ ගිය ද 2014 වසර තුළ දී බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු නොවෙනස්ව පැවතිණි.

## මූලික උද්ධමනය

**ඉහළ මිල විචලනයක් නොදක්වන අයිතම මගින් නියෝජනය කරනු ලබන මූලික උද්ධමනය, වාර්ෂික සාමාන්‍ය පදනම මත 2014 ජනවාරි මස වූ සියයට 4.1 හි සිට ජූනි මාසයේ දී සියයට 3.0 දක්වා ක්‍රමයෙන් පහළ ගිය අතර, ඉන්පසුව ක්‍රමයෙන් ඉහළ යමින් 2014 දෙසැම්බර් මස වන විට සියයට 3.5 දක්වා ළඟා විය.** අඩු විචලතාවක් සහිතව මිශ්‍ර විචලනයක් පෙන්නුම් කළ ලක්ෂ්‍යමය මූලික උද්ධමන අනුපාතිකය, 2014 ජනවාරි මස වාර්තා වූ සියයට 3.5 හි සිට සුළු වශයෙන් පහළ යමින් 2014 දෙසැම්බර් මස වන විට සියයට 3.2 කරා ළඟා විය. ඉල්ලුම් පාර්ශ්වයෙන් ඇතිවන උද්ධමන පීඩන තත්ත්ව මනාව මැඩපවත්වන ලද බව මූලික උද්ධමනය අවම විචලතාවක් සහිතව අඩු මට්ටමක පැවතීම මගින් පිළිබිඹු වේ.

## දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**දේශීයව නිපදවනු ලබන සියලුම භාණ්ඩ සහ සේවාවල මිල ගණන් වෙනස්වීම මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය, ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම මිල මට්ටම් ඉහළ යෑම පහළ මට්ටමක පැවති බැවින්, පසුගිය වසරට සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ නැගිණි.** ඒ අනුව සමස්ත ද.දේ.නි. අවධමනකය 2013 වසරේ වාර්තා වූ සියයට 6.7 හි සිට 2014 වසරේ දී සියයට 5.1 දක්වා පහළ ගියේය. කෘෂිකර්මාන්ත අංශයේ අවධමනකය 2013 වසරේ වූ සියයට 7.0 හි සිට 2014 වසරේ දී සියයට 3.0 දක්වා පහළ ගියේය. රබර්, සුළු අපනයන භෝග, පශු සම්පත් සහ වතු සංවර්ධන උප අංශ හැරුණු විට කෘෂි කර්මාන්ත අංශයේ අනෙකුත් සියලුම උප අංශවල මිල ගණන්හි පහළ යෑමක් දක්නට ලැබිණි. කර්මාන්ත අංශයේ

**4.5 සංඛ්‍යා සටහන** — **දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

(2002=100)

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 (අ) | 2014 (ආ) | 2013/2012 (අ) | 2014/2013 (ආ) |
| කෘෂිකර්මාන්ත | 247.5 | 264.8 | 272.7 | 7.0 | 3.0 |
| කර්මාන්ත | 258.1 | 276.9 | 292.0 | 7.3 | 5.5 |
| සේවා | 244.3 | 259.7 | 272.9 | 6.3 | 5.1 |
| **ද.දේ.නි.** | **248.9** | **265.6** | **279.0** | **6.7** | **5.1** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

විශේෂ සටහන 4

## නිෂ්පාදකයාගේ මිල දර්ශකයක් හඳුන්වාදීම

දේශීය නිෂ්පාදකයන් විසින් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා සඳහා ලබන සාමාන්‍ය මිල ගණන්වල විචලනය මැනීම සඳහා නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද.) භාවිතා කරනු ලැබේ. නි.මි.ද. සාර්ව ආර්ථික විශ්ලේෂණවල දී වැදගත් කාර්යයන් කිහිපයක් ඉටු කරයි. නිෂ්පාදන මට්ටමෙහි ඇති වන මිල විචලනයන් පාරිභෝගික මිල කරා සම්ප්‍රේෂණය වේයැයි අපේක්ෂා කරන බැවින්, දේශීය වෙළඳ පොළවල තොග සහ සිල්ලර භාණ්ඩවල උද්ධමන පීඩනය කල් ඇතිව නිර්ණය කිරීම සඳහා දර්ශකයක් ලෙස නි.මි.ද. භාවිතා කෙරේ. එහෙයින්, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී නි.මි.ද. ඉතා වැදගත් වූ මූලික දර්ශකයක් ලෙස ක්‍රියා කරයි. නි.මි.ද. මගින් අනාගත පාරිභෝගික මිල උද්ධමනයෙහි විචලනය පිළිබඳව සංඥා කෙරෙන බැවින් ආයෝජකයන් එහි විචලනය සමීපස්ථව නිරීක්ෂණය කරන අතර එමගින් ඔවුන්ට වෙළඳාම් මගින් ලද හැකි මුදල් ප්‍රවාහ පිළිබඳ ඇස්තමේන්තු සකසා ගැනීමට හැකියාව ලැබේ. විදේශ වෙළඳාම සිදුවන රටවල් අතර නි.මි.ද. සැසඳීම මගින් අපනයනකරුවන්ට රටවල් අතර උද්ධමන පරතරය තක්සේරු කිරීමට හැකියාව ලැබෙන අතර ඒ අනුව ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රමාණය සහ මිල සැලසුම් කිරීමට හැකි වේ. ජාතික ගිණුම් ඇස්තමේන්තු සැකසීමේ දී පවත්නා මිල ගණන් ස්ථාවර මිල ගණන් බවට අවධමනය කිරීමට නි.මි.ද. ප්‍රයෝජනවත් වේ.

මෑතක දී පවත්වන ලද ආර්ථික සංගණනයේ ප්‍රතිඵල පදනම් කරගනිමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නව නි.මි.දර්ශකයක් ගණනය කිරීමට පියවර ගෙන ඇති අතර එය 2015 වසරේ මැද භාගයේ සිට නිල වශයෙන් හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ. මෙම නව නි.මි.දර්ශකයේ බර තැබීම් 2010 වසරේ වාර්තා වූ වාර්ෂික නිෂ්පාදන වටිනාකම් මත පදනම් වේ. මෙම දර්ශකය මගින් මුල් අවස්ථාවේ දී කෘෂිකර්මාන්ත, නිෂ්පාදන සහ උපයෝගීතා (විදුලිය සහ ජලය) යන අංශ ආවරණය කිරීමටත් පසු අදියරක දී සේවා අංශයේ ක්‍රියාකාරකම් ඇතුළත් කොට පුළුල් කිරීමටත් අපේක්ෂා කෙරේ. කෘෂිකර්මාන්ත අංශය මගින් දිවයිනේ පළාත් නවයෙහිම කෘෂි නිෂ්පාදන 161 ක මිල ගණන් ආවරණය කෙරෙනු ඇත. නිෂ්පාදන අංශය යටතේ සේවකයන් 25 හෝ ඊට වැඩි ආයතනවලින් සියයට 75 ක් ආවරණය කෙරෙනු ඇත. ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණය[1] (International Standard Industrial Classification - ISIC) මත පදනම් වූ අංශ 13 ක් යටතේ වන සමස්ත නිෂ්පාදිතයෙන් සියයට 85 ක් මෙම නියැදිය මගින් ආවරණය කෙරෙනු ඇත.

උපයෝගිතා අංශයෙන්, ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) මගින් විදුලිය උත්පාදනය හා බෙදාහැරීම සහ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් ජලය රැස්කිරීම, පිරිසිදු කිරීම හා බෙදාහැරීම ආවරණය කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් නිකුත් කර ඇති නි.මි.ද. පිළිබඳ අත්පොත පදනම් කරගෙන, ජාත්‍යන්තර නිර්දේශ අනුගමනය කරමින් නි.මි.ද. ගණනය කරනු ලැබේ. දර්ශකය මගින් ආවරණය වන සියලුම ආර්ථික ක්‍රියාකාරකම් ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණයෙහි තෙවන සංස්කරණය අනුව වර්ගීකරණය කර ඇත. ඉදිරියේ දී සේවා අංශයේ ක්‍රියාකාරකම් ඇතුළත් කර ගැනීම, නිෂ්පාදක මිල වෙනුවට මූලික මිල[2] (Basic Price) ගණන් මගින් මිල ඇගයීම සහ නිෂ්පාදන මට්ටමේ දර්ශක පිළිබඳ තොරතුරු බෙදාහැරීම ආදී වැඩිදියුණු කිරීම් සිදුකිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අදහස් කරයි.

ජාතික ගිණුම්වල පදනම් වර්ෂය අලුත් කිරීමට සමගාමීව නි.මි.ද. සම්පාදනය කිරීම මගින් දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය ගණනය කිරීම සඳහා වඩා යථානුරූපී මිල දර්ශකවල අවශ්‍යතාව සැපිරෙනු ඇත. සාර්ව ආර්ථික විශ්ලේෂණ ක්‍රියාවලියේ දී නි.මි.දර්ශකයක කාර්යය දශක හතරක පමණ කාලයක් තුළ සපුරනු ලැබුවේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරනු ලබන තොග මිල දර්ශකය (තො.මි.ද.) මගිනි. ආර්ථිකයේ නිෂ්පාදන ව්‍යුහයේ සිදුව ඇති වෙනස්කම්වලට අනුගතව එම වෙනස්කම් නිරූපණය කිරීම සඳහා කාලයෙන් කාලයට තො.මි.දර්ශකයේ ද අවශ්‍ය සංශෝධන සිදුකරන ලදී. කෙසේ වුවද, කාලයත් සමග දර්ශක ගණනය කිරීමේ ක්‍රමවේදය ද වෙනස් වී ඇත. එම නිසා තො.මි.ද. වෙනුවට වඩා යථානුරූපී සහ නම්‍යශීලී නි.මි.ද. ආදේශ කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඇති අතර, නි.මි.ද. හඳුන්වා දීමෙන් පසු නි.මි.ද. මගින් තො.මි.දර්ශකයෙහි අවශ්‍යතාව සැපිරෙන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තො.මි.ද. ගණනය කිරීම අත්හිටවනු ඇත.

මූලාශ්‍ර :

1. *Producer Price Indices - Comparative Methodological Analysis*, Organisation for Economic Co-operation and Development (2011)

1 මෙය ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන් මත පදනම්ව, එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ප්‍රකාශ කරනු ලබන ආර්ථික ක්‍රියාකාරකම්වල විධිමත් වර්ගීකරණයයි.

2 මූලික මිල යනු නිෂ්පාදකයා විසින් සිය භාණ්ඩ හා සේවාවන් අලෙවි කිරීම සඳහා සූදානම් කරන අවස්ථාවේ දී අදාළ වන මිල වන අතර මෙම මිල සඳහා භාණ්ඩ හා සේවා මත පනවන බදු ඇතුළත් නොවූව ද නිෂ්පාදනයේ දී හෝ විකිණීමේ දී නිෂ්පාදකයා විසින් ලබාගත්, මිල දී ගන්නා ගෙන් අය කරනු ලබන මිල අඩුකිරීමට හේතු වන සහනාධාර ඇතුළත් වේ.

සියලුම උප අංශයන්හි අවධමනක පහළ යමින් එම අංශයේ අවධමනකය පසුගිය වසරේ වාර්තා වූ සියයට 7.3 හි සිට 2014 වසරේ දී සියයට 5.5 දක්වා පහළ ගියේය. දේශීය වෙළඳාම, ප්‍රවාහනය, රාජ්‍ය සේවා සහ පෞද්ගලික සේවා යන උප අංශවල මිල ගණන් පහළ යෑමත් සමග, සේවා අංශයේ අවධමනකය 2013 වසරේ වාර්තා වූ සියයට 6.3 ට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 5.1 දක්වා පහළ ගියේය. වෙළඳ අනුපාතයෙහි

වාසි සහගත තත්ත්වයක් අත්විඳින බව පිළිබිඹු කරමින්, වසර තුළ දී උද්ධමනය, ද.දේ.නි. අවධමනකයට වඩා අඩු මට්ටමක පැවතිණි.

## 4.3 වැටුප්

**2014 වසර තුළ දී රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික යන අංශ තුනෙහිම සේවකයන්ගේ නාමික වැටුප් ඉහළ ගියේය.** රාජ්‍ය සේවකයන්ගේ නාමික වැටුප් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ එම ඉහළ යෑම සාමාන්‍ය වශයෙන් සිදුවිය. අඩු උද්ධමන තත්ත්වයක් පැවතීම හේතුකොට ගෙන මෙම නාමික වැටුප් ඉහළ යෑමෙන් අංශ තුනෙහිම සේවකයන්ගේ මූර්ත වැටුප් ඉහළ ගියේය.

### රාජ්‍ය අංශයේ වැටුප්

**රාජ්‍ය අංශයේ නව වැටුප් ප්‍රමාණ දර්ශකය[1] මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2014 වසරේ දී ඉහළ ගියේය.** 2014 අයවැය මගින් රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මාසික ජීවන වියදම් දීමනාව 2014 ජනවාරි මස සිට රු.1,200 කින් ඉහළ නැංවීම සහ 2015 අයවැය මගින් 2014 නොවැම්බර් මස සිට සියලුම රජයේ සේවකයන් සඳහා රු. 3,000 ක අතුරු දීමනාවක් ලබාදීම මෙම ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටම, තෘතීයික මට්ටම, ද්විතීයික මට්ටම සහ ප්‍රාථමික මට්ටම යන කාණ්ඩ හතරෙහිම නිලධාරීන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක, 2013 වසරේ වාර්තා වූ පිළිවෙළින් සියයට 3.6, සියයට 6.0, සියයට 6.5 සහ සියයට 6.8 ක වැටුප් ඉහළ යෑමට සාපේක්ෂව 2014 වසරේ දී පිළිවෙළින් සියයට 7.0 කින්, සියයට 9.8 කින්, සියයට 10.7 කින් සහ සියයට 11.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මධ්‍යම රජයේ සේවකයන්ගේ සමස්ත නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වසරේ වාර්තා වූ සියයට 6.3 ක ඉහළ යෑමට සාපේක්ෂව 2014 දී සියයට 10.5 කින් ඉහළ ගියේය.

**මේ අතර, රාජ්‍ය අංශයේ සියලුම කාණ්ඩවල සේවකයන් විසින් 2014 වසරේ දී සැලකිය යුතු මූර්ත වැටුප් ඉහළ යෑමක් භුක්ති විඳින ලදී.** ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතීයික සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්ගේ මූර්ත වැටුප්වල 2013 වසරේ සිදු වූ පිළිවෙළින් සියයට 3.2, සියයට 0.9, සියයට 0.5 සහ සියයට 0.1 ක පහළ යෑමට සාපේක්ෂව, 2014 වසරේ දී පිළිවෙළින් සියයට 3.6 ක, සියයට 6.3 ක, සියයට 7.2 ක සහ සියයට 8.1 ක සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා විය. 2013 වසරේ සියයට 0.6 ක පහළ යෑමක් වාර්තා කළ මධ්‍යම රජයේ සේවකයන්ගේ සමස්ත මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය ඉහත සඳහන් වැටුප් වර්ධන හේතුවෙන් 2014 වසරේ

1 රජයේ සේවකයන් සඳහා වූ වඩාත් නියෝජනාත්මක වැටුප් ප්‍රමාණ දර්ශකයක අවශ්‍යතාවය හඳුනාගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව දර්ශකයක් සකසන ලදී. මෙම නව දර්ශකය මගින් විධායක නොවන රජයේ සේවකයන් සහ පාසල් ගුරුවරුන් පමණක් ආවරණය කරනු ලබන පවත්නා දර්ශකය ආදේශ කරනු ලබයි. නව දර්ශකයේ පදනම් වර්ෂය 2012 වේ. නව දර්ශකය මගින් ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතීයික සහ ප්‍රාථමික මට්ටම් යන කාණ්ඩ කිරීම යටතේ සියලු මට්ටම්වල රජයේ සේවකයන් දක්වා ආවරණය පුළුල් කෙරේ. පදනම් කාලපරිච්ඡේදයේ දී සේවා නියුක්ති ව්‍යුහය, 2012 වසරේ දී පැවැත්වූ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ විශේෂ වාර්ෂික සමීක්ෂණයක් මත පදනම් වේ. රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් 2006 අප්‍රේල් 25 වැනි දින නිකුත් කරන ලද අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයෙහි සඳහන් පරිදි එක් එක් වෘත්තීන් සඳහා වූ ආරම්භක වැටුප්තල සහ අදාළ දීමනා දර්ශකය ගණනය කිරීමේ දී භාවිතා කර ඇත.

**4.6 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක**

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | | | ප්‍රතිශත වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | | මූර්ත (අ) | | | නාමික | | | මූර්ත (අ) | | |
| | 2012 | 2013 | 2014 (ආ) | 2012 | 2013 | 2014 (ආ) | 2012 | 2013 | 2014 (ආ) | 2012 | 2013 | 2014 (ආ) |
| 1. රජයේ සේවකයන් | | | | | | | | | | | | |
| **මධ්‍යම රජයේ සේවකයන් (2012=100)** | **100.0** | **106.3** | **117.5** | **103.6** | **103.0** | **110.2** | **3.5** | **6.3** | **10.5** | **-3.7** | **-0.6** | **7.0** |
| ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් | 100.0 | 106.8 | 119.2 | 103.6 | 103.5 | 111.8 | 3.2 | 6.8 | 11.6 | -3.9 | -0.1 | 8.1 |
| ද්විතීයික මට්ටමේ නිලධාරීන් | 100.0 | 106.5 | 117.9 | 103.6 | 103.1 | 110.6 | 3.4 | 6.5 | 10.7 | -3.8 | -0.5 | 7.2 |
| තෘතීයික මට්ටමේ නිලධාරීන් | 100.0 | 106.0 | 116.4 | 103.6 | 102.7 | 109.2 | 3.6 | 6.0 | 9.8 | -3.6 | -0.9 | 6.3 |
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් | 100.0 | 103.6 | 110.8 | 103.6 | 100.3 | 103.9 | 3.9 | 3.6 | 7.0 | -3.3 | -3.2 | 3.6 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | | | | | |
| **සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් (1978=100)** | **3,662.0** | **3,869.2** | **4,012.2** | **106.2** | **104.9** | **105.3** | **22.2** | **5.7** | **3.7** | **13.8** | **-1.2** | **0.4** |
| කෘෂිකර්මාන්තයෙහි නියැලෙන කම්කරුවන් | 4,433.0 | 4,435.9 | 4,560.9 | 128.6 | 120.3 | 119.7 | 29.3 | 0.1 | 2.8 | 20.4 | -6.4 | -0.5 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලෙන කම්කරුවන් | 2,402.1 | 3,191.6 | 3,459.1 | 69.7 | 86.5 | 90.8 | 0.0 | 32.9 | 8.4 | -6.9 | 24.1 | 5.0 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 1,851.8 | 2,241.5 | 2,313.2 | 53.7 | 60.7 | 60.7 | 0.0 | 21.0 | 3.2 | -6.9 | 13.1 | 0.0 |

(අ) මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක, කො.පා.මි.ද. (2006/07=100) පදනම් කොටගෙන ගලපා ඇත.
(ආ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දී සියයට 7.0 කින් ඉහළ ගියේය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල සිදු වූ මෙම ධනාත්මක වර්ධනය සඳහා නාමික වැටුප් වැඩිවීමට අමතරව වසර තුළ දී උද්ධමනය සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම ද බොහෝ සෙයින් දායක විය.

## විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2014 වසරේ දී ඉහළ යෑමක් වාර්තා කළේය.** ඒ අනුව, 2014 වසරේ දී කෘෂිකර්මාන්ත; කර්මාන්ත හා වාණිජ; සහ සේවා අංශවල වැටුප් ප්‍රමාණ දර්ශක පිළිවෙළින් සියයට 2.8 කින්, සියයට 8.4 කින්, සහ සියයට 3.2 කින් ඉහළ ගියේය. 2014 වසරේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුකොටගෙන කෘෂිකර්මාන්ත අංශයේ සිදු වූ පසුබෑම හේතුවෙන් එම අංශයේ නාමික වැටුප් සුළු වශයෙන් ඉහළ ගියේය. කර්මාන්ත හා වාණිජ සහ සේවා අංශවල සේවකයන්ගේ නාමික වැටුප් 2013 වසරේ පිළිවෙළින් සියයට 32.9 කින් සහ සියයට 21.0 කින් ඉහළ ගිය අතර 2014 වසරේ දී සුළු වශයෙන් ඉහළ ගියේය. සමස්ත දර්ශකයෙන් සියයට 66 ක් වන කෘෂිකර්මාන්ත අංශයෙහි සුළු වර්ධනයක් වාර්තා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ දී නාමික වශයෙන් සියයට 5.7 ක වර්ධනයක් වාර්තා කළ සංයුක්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2014 වසරේ දී ඉහළ ගියේ සියයට 3.7 කින් පමණි.

**විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්, 2014 වසරේ දී සුළු ඉහළ යෑමක් වාර්තා කළේය.** කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් 2014 වසරේ දී සියයට 5.0 කින් ඉහළ ගිය අතර කෘෂිකර්මාන්ත අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 0.5 කින් පහළ ගියේය. තවද, 2013 වසරේ දී ඉහත සඳහන් කාණ්ඩවල සේවකයන්ගේ මූර්ත වැටුප්වල පිළිවෙළින් සියයට 24.1 ක වර්ධනයක් සහ සියයට 6.4 ක පහළ යෑමක් සිදු වූ බව සඳහන් කිරීම වැදගත්ය. කෙසේ වුවද, 2013 වසරේ සේවා අංශයේ මූර්ත වැටුප්වල සිදු වූ සියයට 13.1 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී එය නොවෙනස්ව පැවතිණි. දර්ශකයේ බර තැබීමේ ව්‍යුහය හේතුකොටගෙන, කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ප්‍රතිලාභයට වඩා කෘෂිකර්මාන්ත අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ යෑමෙහි බලපෑම අඩු වූ බැවින්, විධිමත් පෞද්ගලික අංශයේ සංයුක්ත මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වසරේ වූ සියයට 1.2 ක පහළ යෑමට සාපේක්ෂව, 2014 වසරේ දී සියයට 0.4 ක සුළු ඉහළ යෑමක් වාර්තා කළේය.

## අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**සමස්තයක් වශයෙන් 2014 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සාමාන්‍ය දෛනික වැටුප්, නාමික සහ මූර්ත යන දෙයාකාරයෙන්ම ඉහළ ගියේය.** අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්, වෙළඳ පොළ බලවේග මගින් තීරණය වනු ලබන අතර, ශ්‍රම වෙළඳ පොළෙහි ඉල්ලුම් සහ සැපයුම් සාධකයන්හි විචලනයන්ට අනුව නාමික වැටුප් නිර්ණය වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කෙරෙන දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ මගින් කෘෂිකර්මාන්ත සහ ගොඩනැගිලි ඉදිකිරීම් අංශ ආවරණය කරමින් රැස්කරනු ලබන අදාළ වැටුප් දත්ත භාවිතා කරමින්, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කෙරේ.

**2014 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සාමාන්‍ය දෛනික වැටුප්, නාමික වශයෙන් සියයට 5.6 කින් ඉහළ ගියේය.** අවිධිමත් කෘෂිකර්මාන්ත සහ ඉදිකිරීම් අංශවල සේවකයන්ගේ නාමික වැටුප්, 2013 වසරේ වූ පිළිවෙළින් සියයට 12.0 ක සහ සියයට 8.0 ක ඉහළ යෑමට සාපේක්ෂව, 2014 වසරේ දී පිළිවෙළින් සියයට 5.5 කින් සහ සියයට 5.7 කින් ඉහළ ගියේය. කෘෂිකර්මාන්ත අංශය තුළ රබර්, පොල්, වී සහ තේ යන උප කාණ්ඩවල සාමාන්‍ය දෛනික වැටුප් 2014 වර්ෂය තුළ පිළිවෙළින් සියයට 5.2 කින්, සියයට 6.4 කින්, සියයට 4.3 කින් සහ සියයට 6.7 කින් ඉහළ ගියේය. ඉදිකිරීම් අංශය තුළ වඩු කාර්මිකයන් සහ පෙදරේරුවන් විසින් උපයනු ලබන සාමාන්‍ය දෛනික වැටුප් 2013 වසරේ සිදු වූ පිළිවෙළින් සියයට 8.0 ක සහ සියයට 8.1 ක ඉහළ යෑමට සාපේක්ෂව 2014 වසරේ දී පිළිවෙළින් සියයට 5.7 සහ සියයට 5.8 බැගින් වූ වර්ධනයක් වාර්තා කළේය. ශ්‍රමය සඳහා වූ අධික ඉල්ලුම සහ විදේශ ශ්‍රම සංක්‍රමණය හේතුවෙන් ශ්‍රම සැපයුමෙහි තරමක් දුරට සිදු වූ සංකෝචනය, ඉදිකිරීම් අංශයේ මෙම වැටුප් විචලනවලට හේතු වූවා විය හැකිය.

**අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සාමාන්‍ය දෛනික වැටුප්, වසර තුළ දී මූර්ත වශයෙන් සියයට 2.2 කින් වැඩි විය.** තේ, රබර්, පොල් සහ වී යන උප අංශවල මූර්ත සාමාන්‍ය දෛනික වැටුප් පිළිවෙළින් සියයට 3.3 කින්, සියයට 1.9 කින්, සියයට 3.0 කින් සහ සියයට 1.0 කින් ඉහළ ගියේය. ඉදිකිරීම් අංශයේ වඩු කාර්මිකයන් සහ පෙදරේරුවන් විසින් වසර තුළ

**4.7 සංඛ්‍යා සටහන** **අංශය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් (අ)**

| අංශය | වාර්ෂික සාමාන්‍යය (රුපියල්) | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | නාමික | | මූර්ත (ඇ) | |
| | 2012 | 2013 | 2014 (ආ) | 2013 | 2014 (ආ) | 2013 | 2014 (ආ) |
| 1. කෘෂිකර්මාන්ත අංශය | | | | | | | |
| තේ | | | | | | | |
| පුරුෂ | 691 | 764 | 819 | 10.6 | 7.2 | 3.4 | 3.8 |
| ස්ත්‍රී | 512 | 565 | 598 | 10.4 | 5.9 | 3.2 | 2.5 |
| රබර් | | | | | | | |
| පුරුෂ | 741 | 853 | 881 | 15.2 | 3.2 | 7.7 | -0.1 |
| ස්ත්‍රී | 585 | 652 | 702 | 11.4 | 7.7 | 4.2 | 4.3 |
| පොල් (ඈ) | | | | | | | |
| පුරුෂ | 887 | 997 | 1,061 | 12.3 | 6.5 | 5.0 | 3.1 |
| වී | | | | | | | |
| පුරුෂ | 787 | 882 | 937 | 12.1 | 6.3 | 4.8 | 2.9 |
| ස්ත්‍රී | 599 | 667 | 678 | 11.4 | 1.6 | 4.2 | -1.6 |
| 2. ඉදිකිරීම් අංශය (ඈ) | | | | | | | |
| වඩුකාර්මික | | | | | | | |
| වඩුකාර්මික - පිරිමි | 1,248 | 1,334 | 1,406 | 6.9 | 5.4 | 0.0 | 2.1 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරු - පිරිමි | 824 | 903 | 958 | 9.6 | 6.1 | 2.5 | 2.8 |
| පෙදරේරු | | | | | | | |
| පෙදරේරු - පිරිමි | 1,216 | 1,304 | 1,376 | 7.2 | 5.5 | 0.3 | 2.2 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරු - පිරිමි | 823 | 900 | 955 | 9.4 | 6.1 | 2.3 | 2.7 |

(අ) වැටුප් විස්තර, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩසටහන මගින් ආවරණය වන මධ්‍යස්ථානයන්හි මාසික වැටුප් පදනම්කොට ගෙන සකස් කර ඇත (2012-2013: මධ්‍යස්ථාන 102, 2014: මධ්‍යස්ථාන 106).
(ආ) තාවකාලික
(ඇ) මූර්ත වැටුප්, කො.පා.මි.ද. (2006/07=100) පදනම් කොටගෙන ගලපා ඇත.
(ඈ) මෙම අංශවල කාන්තා සහභාගිත්වය අවම මට්ටමක පවතී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දී පිළිවෙළින් සියයට 2.3 ක සහ සියයට 2.4 ක මූර්ත වැටුප් වර්ධනයක් භුක්ති විඳින ලදී. කෘෂිකර්මාන්ත සහ ඉදිකිරීම් අංශවල සමස්ත මූර්ත වැටුප්වල 2013 වසරේ වාර්තා වූ පිළිවෙළින් සියයට 4.8 ක සහ සියයට 1.1 ක ඉහළ යෑමට සාපේක්ෂව 2014 වසරේ දී පිළිවෙළින් සියයට 2.1 ක සහ සියයට 2.4 ක ඉහළ යෑමක් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සමස්ත දෛනික මූර්ත වැටුප්, සාමාන්‍ය වශයෙන්, 2013 වසරේ සිදු වූ සියයට 3.1 ක ඉහළ යෑමට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 2.2 කින් ඉහළ ගියේය.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

2014 වසරේ දී මධ්‍ය වාර්ෂික ජනගහනය දශ ලක්ෂ 20.675 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එහි වාර්ෂික වර්ධන අනුපාතිකය සියයට 0.9 ක් විය. මෙය ගැහැණු දශ ලක්ෂ 10.642 කින් සහ පිරිමි දශ ලක්ෂ 10.033 කින් සමන්විත විය. මුලතිව් දිස්ත්‍රික්කය හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවල දායකත්වයෙන් ජනගහන ඝනත්වය[2] 2013 වසරේ පැවති 327 හි සිට 2014 වසරේ දී 330 දක්වා අඛණ්ඩව ඉහළ ගියේය. බස්නාහිර පළාත 2014 වසරේ දී 41,000 ක් වන වැඩිම ජනගහන වර්ධනය වාර්තා කළ අතර එය සමස්ත ජනගහනයෙන් හතරෙන් එකකටත් වඩා වැඩි ජනගහනයක් සහිත පළාත විය. අඩුතම ජනගහනයක් සහිත උතුරු පළාත 2014 වසරේ දී 9,000 ක් වන අඩුම ජනගහන වර්ධනය වාර්තා කළේය. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජනගහනය වෙන් වෙන් වශයෙන් ගත් කළ දශ ලක්ෂ 2 ඉක්ම වූ අතර එක්ව ගත් විට සමස්ත ජනගහනයෙන් පහෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා දායක විය. කුරුණෑගල, මහනුවර, කළුතර, රත්නපුර සහ ගාල්ල යන සෑම දිස්ත්‍රික්කයකම ජනගහනය දශ ලක්ෂය ඉක්මවීය. මෙයට ප්‍රතිවිරුද්ධව යමින් 2014 වසරේ දී මුලතිව් දිස්ත්‍රික්කයේ ජනගහනය 93,000 ක් ලෙස වාර්තා වූ අතර එය ලක්ෂයකට වඩා අඩු ජනගහනයක් සහිත එකම දිස්ත්‍රික්කය වේ. රෙජිස්ට්‍රාර්

2 වර්ග කිලෝ මීටරයකට පුද්ගලයන් සංඛ්‍යාව

**4.8 සංඛ්‍යා සටහන**

**දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)**

| දිස්ත්‍රික්කය | 2013 | | 2014 | |
|---|---|---|---|---|
| | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය |
| කොළඹ | 2,326 | 3,441 | 2,343 | 3,466 |
| ගම්පහ | 2,313 | 1,725 | 2,328 | 1,736 |
| කළුතර | 1,227 | 779 | 1,236 | 784 |
| මහනුවර | 1,384 | 722 | 1,397 | 729 |
| මාතලේ | 489 | 251 | 494 | 253 |
| නුවරඑළිය | 719 | 421 | 728 | 427 |
| ගාල්ල | 1,068 | 660 | 1,077 | 666 |
| මාතර | 819 | 645 | 826 | 650 |
| හම්බන්තොට | 606 | 243 | 616 | 247 |
| යාපනය | 589 | 634 | 593 | 638 |
| මන්නාරම | 101 | 54 | 102 | 54 |
| වව්නියාව | 174 | 93 | 176 | 95 |
| මුලතිව් | 93 | 39 | 93 | 39 |
| කිලිනොච්චිය | 116 | 96 | 118 | 98 |
| මඩකලපුව | 529 | 203 | 534 | 205 |
| අම්පාර | 658 | 156 | 666 | 158 |
| ත්‍රිකුණාමලය | 384 | 152 | 389 | 154 |
| කුරුණෑගල | 1,624 | 351 | 1,636 | 354 |
| පුත්තලම | 769 | 267 | 778 | 270 |
| අනුරාධපුරය | 868 | 130 | 879 | 132 |
| පොළොන්නරුව | 408 | 133 | 412 | 134 |
| බදුල්ල | 822 | 291 | 831 | 294 |
| මොණරාගල | 456 | 83 | 463 | 84 |
| රත්නපුරය | 1,097 | 339 | 1,110 | 343 |
| කෑගල්ල | 844 | 501 | 850 | 504 |
| **සමස්ත දිවයින** | **20,483** | **327** | **20,675** | **330** |

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

(ආ) 2012 වසරෙන් පසුව මැදි වසර ජනගහනය ගණනය කිරීම, 2012 ජන හා නිවාස සංගණනයේ මූලික දත්ත සහ ජනගහනයේ ස්වාභාවික වර්ධනය හා 2012 මාර්තු 20 සිට ජුනි 30 දක්වා කාලය තුළ ශුද්ධ සංක්‍රමණ දත්ත මත පදනම් වේ.

සටහන: 2012 මාර්තු 20 වැනි දිනට පසුව උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීම් හේතුවෙන්, දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනයේ සිදුවන වෙනස්වීම් මෙම ගණනය කිරීම් සඳහා ඇතුළත්ව නොමැත.

ජෙනරාල් දෙපාර්තමේන්තුවට අනුව, 2014 වසරේ දී මධ්‍ය වාර්ෂික ජනගහනය සඳහා අදාළ වන, රට තුළට පැමිණි සහ රටෙන් පිට වූ පුද්ගල සංඛ්‍යාව දහස් ගණනින් ගත් විට පිළිවෙළින් 2,763 ක් සහ 2,807 ක් වූ අතර ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය සියයට -2.2 ක් විය. වයස් ව්‍යුහය අනුව ජනගහනය සැලකූ විට සමස්ත ජනගහනයෙන් සියයට 57.2 ක් අවුරුදු 15 - 54 දක්වා වයස් කාණ්ඩයට අයත් විය. වයස අවුරුදු 0 - 14 සහ අවුරුදු 55 හා ඊට වැඩි ජනගහනය පිළිවෙළින් සියයට 25.3 ක් සහ සියයට 17.5 ක් විය.

## ශ්‍රම බලකාය

වයස අවුරුදු 15 ට වැඩි ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය ලෙස අර්ථ දැක්වෙන ශ්‍රම බලකාය 2013 වසර සමග සසඳන විට 2014 වසරේ දී සුළු වශයෙන් ඉහළ ගියේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව ශ්‍රම බලකාය දශ ලක්ෂ 8.802 හි සිට දශ ලක්ෂ 8.805 දක්වා සියයට 0.03 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. අමතර ශ්‍රමය අවශෝෂණය කර ගැනීම සඳහා ආර්ථිකය සතු හැකියාවේ වර්ධනයක් පිළිබිඹු කරමින් වසර තුළ දී සේවා නියුක්තිකයන් සංඛ්‍යාව ඉහළ ගිය අතර සේවා වියුක්තිකයන් සංඛ්‍යාව පහළ ගියේය.

ශ්‍රම බලකාය ඉහළ ගිය ද, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය[3] 2013 වසරේ වාර්තා කළ සියයට 53.8 හි සිට 2014 වසරේ දී සියයට 53.3 දක්වා පහළ වැටිණි. 2014 වසර තුළ දී ශ්‍රම බලකායට වඩා වැඩි වේගයකින් සේවයේ යෙදිය හැකි වයසේ ජනගහනය වර්ධනය වීම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ යෑමට හේතු විය. විශේෂයෙන්ම වසර පුරා ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයෙහි පහළ යෑම් පෙන්නුම් කරමින් ස්ත්‍රී සහභාගිත්වය අඩු වීමත් සමග ග්‍රාමීය ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 55.0 හි සිට සියයට 54.1 දක්වා අඩු වීම මෙම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයෙහි පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ස්ත්‍රී සහ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික

3 ශ්‍රම බලකාය, වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස

**4.9 සංඛ්‍යා සටහන**

**කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)**

| ශීර්ෂය | 2013 | 2014 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000 | **16,360** | **16,420** | **16,454** | **16,646** | **16,608** | **16,532** |
| ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | **8,802** | **8,770** | **8,812** | **8,854** | **8,783** | **8,805** |
| සේවා නියුක්ත | 8,418 | 8,407 | 8,413 | 8,480 | 8,396 | 8,424 |
| සේවා වියුක්ත | 384 | 362 | 399 | 374 | 387 | 381 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඇ) | **53.8** | **53.4** | **53.6** | **53.2** | **52.9** | **53.3** |
| පුරුෂ | 74.9 | 74.4 | 75.2 | 74.6 | 74.3 | 74.6 |
| ස්ත්‍රී | 35.6 | 35.3 | 34.8 | 34.4 | 34.5 | 34.8 |

(අ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.

(ආ) තාවකාලික

(ඇ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දෙකෙහිම පහළ යෑමක් මෙම කාලය තුළ වාර්තා වන බව, ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික සංඛ්‍යා ලේඛන මගින් හෙළිවෙයි. පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 74.9 හි සිට සියයට 74.6 දක්වා සුළු වශයෙන් පහළ වැටුණු අතර ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 35.6 හි සිට සියයට 34.8 දක්වා පහළ ගියේය.

### සේවා නියුක්තිය

**සේවා නියුක්තික පුද්ගලයන් සංඛ්‍යාව පෙර වසරේ පැවැති දශ ලක්ෂ 8.418 සමග සසඳන විට 2014 වසරේ දී දශ ලක්ෂ 8.424 දක්වා සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.** කර්මාන්ත සහ සේවා අංශ පුළුල්වීම හේතුවෙන් එම අංශවල සේවා නියුක්ති අවස්ථා වැඩි වීම මෙම ඉහළ යෑම තුළ ප්‍රධාන වශයෙන් දැකිය හැකි විය. කෙසේ වුවද, 2014 වසරේ බොහෝ කාලවල පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් කෘෂි කර්මාන්ත අංශයේ සිදු වූ පසුබෑම වසර තුළ එම අංශයෙහි සේවා නියුක්ත පුද්ගල සංඛ්‍යාව පහළ දැමීමට හේතු විය. ඒ අනුව, 2014 වසර තුළ දී කෘෂි කර්මාන්ත අංශයේ සේවා නියුක්තික සංඛ්‍යාවේ දායකත්වය පෙර වසරේ දී වාර්තා වූ සියයට 29.7 හි සිට සියයට 28.5 දක්වා පහත වැටිණි. කර්මාන්ත අංශයේ සේවා නියුක්ති දායකත්වය 2013 වසරේ දී වාර්තා වූ සියයට 26.2 හි සිට 2014 වසරේ දී සියයට 26.5 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. නිෂ්පාදන සහ ඉදිකිරීම් උප අංශවල සිදු වූ වර්ධනය කර්මාන්ත අංශයේ ක්‍රියා උත්පාදනය සඳහා ඉවහල් විය. 2013 වසරේ දී සමස්ත සේවා නියුක්තියෙන් සියයට 44.1 ක් ලෙස වාර්තා වූ සේවා අංශයේ දායකත්වය 2014 වසරේ දී සියයට 45.0 දක්වා ඉහළ නංවමින් සේවා අංශය අඛණ්ඩව ආර්ථිකය තුළ ක්‍රියා අවස්ථා ඇති කිරීමේ ප්‍රමුඛයා බවට පත්විය.

**4.10 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය (අ)(ආ)**

| අංශය | පුද්ගලයන් '000 | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 (ඇ) | | | | | 2013 | 2014 (ඇ) |
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | | |
| **කෘෂිකර්මාන්ත** | **2,505** | **2,222** | **2,369** | **2,455** | **2,553** | **2,400** | **29.7** | **28.5** |
| **කර්මාන්ත** | **2,202** | **2,339** | **2,189** | **2,253** | **2,134** | **2,229** | **26.2** | **26.5** |
| පතල් හා කැණීම් | 100 | 85 | 76 | 92 | 63 | 79 | 1.2 | 1.0 |
| නිෂ්පාදන | 1,514 | 1,678 | 1,511 | 1,523 | 1,430 | 1,535 | 18.0 | 18.2 |
| ඉදිකිරීම්, විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම, ජල එකතු කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීම (ගොවිතැන් කටයුතු හැර) | 588 | 576 | 602 | 638 | 641 | 615 | 7.0 | 7.3 |
| **සේවා** | **3,711** | **3,846** | **3,855** | **3,772** | **3,709** | **3,795** | **44.1** | **45.0** |
| තොග සහ සිල්ලර වෙළඳාම, මෝටර් වාහන හා යතුරු පැදි අලුත්වැඩියා කිරීම | 1,151 | 1,093 | 1,136 | 1,131 | 1,082 | 1,111 | 13.7 | 13.2 |
| ප්‍රවාහනය සහ ගබඩා කිරීම | 517 | 554 | 480 | 570 | 508 | 528 | 6.1 | 6.3 |
| නවාතැන් හා ආහාර සැපයීම | 188 | 218 | 169 | 219 | 192 | 200 | 2.2 | 2.4 |
| තොරතුරු හා සන්නිවේදන ප්‍රකාශන කටයුතු | 63 | 75 | 87 | 53 | 71 | 71 | 0.7 | 0.8 |
| මූල්‍ය සහ රක්ෂණ කටයුතු | 153 | 161 | 170 | 153 | 159 | 161 | 1.8 | 1.9 |
| වෘත්තිය, විද්‍යාත්මක හා තාක්ෂණ කටයුතු | 68 | 54 | 60 | 42 | 54 | 52 | 0.8 | 0.6 |
| පරිපාලනමය සහ සහාය සේවා කටයුතු | 107 | 99 | 116 | 107 | 127 | 112 | 1.3 | 1.3 |
| රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂණය අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණය | 629 | 651 | 685 | 667 | 620 | 656 | 7.5 | 7.8 |
| අධ්‍යාපනය | 330 | 372 | 339 | 292 | 361 | 341 | 3.9 | 4.0 |
| මහජන සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු | 141 | 144 | 141 | 124 | 144 | 138 | 1.7 | 1.6 |
| වෙනත් (ඈ) | 364 | 425 | 472 | 414 | 391 | 425 | 4.3 | 5.1 |
| **මුළු සේවා නියුක්තිය** | **8,418** | **8,407** | **8,413** | **8,480** | **8,396** | **8,424** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 95.6 | 95.9 | 95.5 | 95.8 | 95.6 | 95.7 | | |

(අ) ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ආ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ඇ) තාවකාලික
(ඈ) නිවැසියන්ගේ පරිහරණය සඳහා සම්පාදනය කරනු ලබන සේවා යෝජක කටයුතු, දේපළ වෙළඳාම් කටයුතු, කලා හා පොදු විනෝදාත්මක කටයුතු සහ ජාත්‍යන්තර සංවිධාන කටයුතු ඇතුළත් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**විශේෂ සටහන 5**

## ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීමේ වැදගත්කම

### හැඳින්වීම

ඉදිරි වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉතා ශීඝ්‍ර වර්ධනයක් ඉලක්ක කර ඇති අතර එවන් තිරසාර වර්ධන වේගයක් පවත්වා ගැනීම සඳහා රටෙහි පවතින සියලුම සම්පත් උපරිමව ප්‍රයෝජනයට ගතයුතු වේ. සම්පත් උපයෝජනය පිළිබඳව සලකා බැලීමේ දී, විශ්‍රාම වයස අවුරුදු 60 ක් ලෙස සැලකුවහොත් ප්‍රජා විද්‍යා සංක්‍රාන්තිය හේතුවෙන් ශ්‍රී ලංකාව මේ වන විට භුක්ති විඳින ප්‍රජා විද්‍යාත්මක ප්‍රතිලාභය 2017 වසර වන විට අහිමි වන සහ රටෙහි සේවා වියුක්ති අනුපාතිකය පහළ යමින් පවතින තත්ත්වයක් මධ්‍යයේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ මට්ටමක පැවතීම විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණකි (De Silva, 2012). වර්ධන විභවයක් ඇතැයි හඳුනාගත් ක්ෂේත්‍රවල ඉහළ යමින් පවතින ශ්‍රම ඉල්ලුම සැපිරිය හැකි, පුහුණු සහ ශිල්පීය දක්ෂතා සහිත ශ්‍රම බලකායක් පැවතීම ආර්ථිකය සැලකිය යුතු වේගයකින් වර්ධනය වීම සඳහා අවශ්‍ය වේ. ප්‍රධාන යෙදවුම පුහුණු ශ්‍රමිකයන් ලෙස සැලකෙන, සේවා මත පදනම් වූ කර්මාන්ත ශ්‍රී ලංකාවේ ඉදිරි ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් උපකාරී වෙතැයි අපේක්ෂා කෙරේ.

ආර්ථිකයක සේවා වියුක්ති අනුපාතිකය පහළ යෑම, රැකියා සොයන පුද්ගලයන් බහුතරයක් සේවා නියුක්ත වීම පිළිබඳ යහපත් සංඥාවක් ලෙස පිළිගැනෙන බැවින් එය ආර්ථිකමය වශයෙන් ධනාත්මක වර්ධනයක් ලෙස සාමාන්‍යයෙන් සැලකේ. කෙසේ වුවද, ප්‍රසාරණය වන ආර්ථිකයක වැඩි වන ශ්‍රම අවශ්‍යතා සැපිරීමට ශ්‍රම වෙළඳ පොළ අසමත් වන තත්ත්වයක්, එනම් ශ්‍රම හිඟයක් පිළිබඳව ද මෙමගින් සංඥා කෙරේ. 2014 වසරේ ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකය සියයට 4.3 ක් විය. ශ්‍රම හිඟය, බොහෝ පෞද්ගලික අංශයේ ආයතන තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමේ දී මුහුණ දෙන ප්‍රධානම ගැටලුවක් බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙන්[1] අනාවරණය වී ඇත. කෙසේ වුවද, මෙම ශ්‍රම හිඟය මුළුමනින්ම පුද්ගලයන්ගේ ඌණතාවයක් නිසා සිදුවූවක් නොවන අතර ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ[2] අඩු වීම ද ඒ සඳහා හේතු වී ඇත. පසුගිය වසර කිහිපයේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 53 ක් පමණ විය. වැඩ කරන වයසේ ජනගහනයෙන් හරි අඩකටම ආසන්න පිරිසකට රැකියාවක නිරතවීම සඳහා උනන්දුවක් නොමැති බව සියයට 53 ක් වැනි අඩු ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය මගින් පැහැදිළි කළ හැකිය. කෙසේ වුවද, වැඩ කරන වයසේ පසුවන මෙම කොටස ශ්‍රම බලකාය වෙත ආකර්ෂණය කර ගත හැකි වුවහොත් ශ්‍රම වෙළඳ පොළේ පවතින පීඩනය අඩු කර ගත හැකි වනු ඇත.

වසර කිහිපයකින් අප රටට සැලකිය යුතු ප්‍රජා විද්‍යාත්මක වෙනසක් අත්විඳීමට සිදුවෙතැයි අපේක්ෂිත මේ අවස්ථාවේ ශ්‍රම බලකාය වෙත වැඩි ශ්‍රමිකයන් පිරිසක් ආකර්ෂණය කරගැනීම වඩා වැදගත් වේ. ප්‍රජා විද්‍යාත්මක ප්‍රතිලාභ ලබන යුගයේ (Demographic Bonus era) සිට ජනගහනය වියපත් වන යුගය (Ageing Population era) දක්වා අප රට පරිවර්තනය වීමේ දී ලෝක බැංකු පුරෝකථනයන්ට අනුව, සෑම පුද්ගලයන් සිව් දෙනෙකුගෙන් කෙනෙකු වයස අවු.60 ට වැඩි වීමත් සමඟ, අනාගතයේ දී යැපීම් අනුපාතික[3] ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. අඩු පුද්ගල සංඛ්‍යාවකගේ ආදායම, වැඩි යැපෙන්නන් සංඛ්‍යාවක් සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම තත්ත්වයත් සමග දරිද්‍රතා ගැටලුව ද හිස ඔසවයි. ජනගහනය තුළ යැපෙන්නන්ගේ සංඛ්‍යාව වැඩි වීමත් සමග, වියපත් ජනගහනයේ ඉල්ලීම් සහ අවශ්‍යතා සැපිරීම සඳහා රටෙහි දැනට පවත්නා සමාජ ආරක්ෂණ පද්ධතිය ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, දරිද්‍රතාවයට ගොදුරුවූවන් සහ ඊට ගොදුරු වීමේ අවදානම ඇති කාණ්ඩ පිළිබඳ අවධානය යොමු කිරීම වඩා අභියෝගාත්මක වනු ඇත. රජයේ ආධාරයක් හෝ විශ්‍රාම වැටුපක් නොලබන බැවින්, ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් සමාජමය වශයෙන් අනාරක්ෂිත තත්ත්වයකට මුහුණ පා ඇත (World Bank, 2013). ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ වර්තමාන ප්‍රවණතා ඉදිරියටත් පැවතුණහොත් ප්‍රජා විද්‍යාත්මක ප්‍රතිලාභ සමයෙන් පසුව වියපත් ජනගහනයේ අවශ්‍යතා සපුරමින් සාමාන්‍ය මට්ටමේ ජීවන තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා, වත්මන් ශ්‍රම බලකායට අමතර පරිශ්‍රමයක් දැරීමට සිදුවනු ඇත. එමනිසා, ආර්ථික වර්ධනයට උපකාරී වීම සඳහා සහ සමස්ත ජනගහනයේ සුබසාධන මට්ටම පවත්වා ගැනීම සඳහා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මේ අවස්ථාවේ දී අතිශයින් වැදගත් වේ.

### අඩු ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය

සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සඳහා ප්‍රධාන වශයෙන්ම අඩු ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය හේතු වී ඇත (සංඛ්‍යා සටහන වි.ස. 5.1). වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 75 ක් පමණ වන අතර, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 35 ක් පමණ වේ. කලාපයේ අනෙකුත් රටවල් සහ සැසඳිය හැකි අනෙකුත් රටවල් සමග ගත් කල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය සැලකිය යුතු අඩු මට්ටමක් වාර්තා කරයි (සංඛ්‍යා සටහන වි.ස. 5.2). ලෝකයේ ශ්‍රම බලකා සහභාගිත්වය

1 ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, ආර්ථිකයෙහි සියලුම අංශ නියෝජනය කරන මහා පරිමාණ ව්‍යාපාර ආයතනවලින් සමන්විත නියැදියක් ආවරණය කරමින් සෑම කාර්තුවකම පවත්වනු ලැබේ.

2 ශ්‍රම බලකාය, අවු.15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට එය ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ.

3 වයස අවු. 15 සහ 59 අතර පුද්ගලයන් සංඛ්‍යාවට යැපෙන්නන් සංඛ්‍යාව දරන අනුපාතය යැපීම් අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ.

**සංඛ්‍යා සටහන වි.ස. 5.1**

**ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගිත්වය සහ සේවා වියුක්ති අනුපාතිකය (2009 - 2014)**

| වර්ෂය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය | | | සේවා වියුක්ති අනුපාතිකය | | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | සමස්ත | පුරුෂ | ස්ත්‍රී | සමස්ත |
| 2009 | 74.7 | 36.2 | 54.1 | 4.3 | 8.6 | 5.9 |
| 2010 | 75.0 | 34.4 | 53.4 | 3.5 | 7.7 | 4.9 |
| 2011 | 74.0 | 34.4 | 53.0 | 2.7 | 7.0 | 4.2 |
| 2012 | 75.0 | 32.9 | 52.6 | 2.8 | 6.2 | 4.0 |
| 2013 | 74.9 | 35.6 | 53.8 | 3.2 | 6.6 | 4.4 |
| 2014 | 74.6 | 34.8 | 53.3 | 3.2 | 6.5 | 4.3 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අනුව වැඩිම ස්ත්‍රී පුරුෂ පරතරය වාර්තා කරන රටවල් අතුරින් ශ්‍රී ලංකාව 28 වන ස්ථානයේ පවතින බව ලෝක බැංකු දත්ත පෙන්වා දෙයි. සේවා නියුක්තිය, ස්වයං රැකියා, ශ්‍රම බලකා සහභාගිත්වය සහ වැටුප් සම්බන්ධයෙන් දැකිය හැකි ස්ත්‍රී පුරුෂ පරතරය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායමෙන් සියයට 20 ක් අහිමි වන බව රටවල් 126 ක් සම්බන්ධයෙන් සිදුකළ ස්ත්‍රී පුරුෂ පරතරය නිසා අහිමිවන ඒක පුද්ගල ආදායම පිළිබඳ අධ්‍යයනයක් මගින් පෙන්වා දෙයි (Teignier and Cuberes, 2014).

**සංඛ්‍යා සටහන වි.ස. 5.2**

**තෝරාගත් රටවල් කිහිපයක ස්ත්‍රී සහ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික (2008 සහ 2013)**

| රට | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) | | | |
|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | |
| | 2008 | 2013 | 2008 | 2013 |
| ශ්‍රී ලංකාව | 76.1 | 74.9 | 36.6 | 35.6 |
| බංගලාදේශය | 84.5 | 84.1 | 56.3 | 57.4 |
| ඉන්දියාව | 81.8 | 79.9 | 31.8 | 27.0 |
| මැලේසියාව | 75.7 | 75.5 | 44.3 | 44.4 |
| නේපාලය | 87.9 | 87.1 | 79.8 | 79.9 |
| සිංගප්පූරුව | 77.3 | 77.2 | 56.4 | 58.8 |
| තායිලන්තය | 81.5 | 80.7 | 65.8 | 64.3 |
| චීනය | 78.3 | 78.3 | 64.6 | 63.9 |
| ජපානය | 72.9 | 70.4 | 48.5 | 48.8 |
| කෙන්යාව | 71.0 | 72.4 | 60.9 | 62.2 |
| කාම්බෝජය | 86.1 | 86.5 | 79.1 | 78.8 |
| වියට්නාමය | 81.3 | 82.2 | 72.2 | 73.0 |

මූලයන් : ලෝක බැංකු දත්ත
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පසුගිය වසර කිහිපය පුරා ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය මෙන් දෙගුණයක් වන බව ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවා වියුක්ති අනුපාතික මගින් තවදුරටත් පෙන්වා දෙයි (සංඛ්‍යා සටහන වි.ස. 5.1). සේවයෙහි යෙදීමට කැමති ස්ත්‍රීන් සංඛ්‍යාව සාපේක්ෂව අඩු අගයක් ගත්ත ද, ඔවුන්ට ශ්‍රම වෙළඳ පොළ තුළ සේවා නියුක්ත වීම පුරුෂයන්ට වඩා දුෂ්කර බව මෙයින් පිළිබිඹු වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, ආසන්න වශයෙන් සියයට 25 ක් වන ආර්ථික වශයෙන් සක්‍රිය නොවන වැඩ කළ හැකි වයසේ පුරුෂයන්ගෙන්

**සංඛ්‍යා සටහන වි.ස. 5.3**

**ස්ත්‍රී පුරුෂ භාවය අනුව ආර්ථික වශයෙන් අක්‍රිය වීමට හේතු (2011 - 2013)**

| හේතුව | සමස්ත | | | පුරුෂ | | | ස්ත්‍රී | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 |
| ගෘහස්ථ වගකීම්වල නිරතවීම | 39.3 | 41.6 | 48.0 | 4.4 | 4.8 | 5.9 | 54.7 | 57.1 | 62.1 |
| අධ්‍යාපන කටයුතුවල නිරතවීම | 35.9 | 35.3 | 20.5 | 57.7 | 59.2 | 37.8 | 26.4 | 25.2 | 14.7 |
| විශ්‍රාමික/ වයස්ගත | 16.4 | 15.5 | 20.7 | 23.5 | 23.0 | 34.8 | 13.2 | 12.4 | 15.9 |
| ශාරීරික රෝග/දුබලතා | 5.1 | 4.5 | 6.1 | 9.1 | 8.2 | 12.9 | 3.4 | 3.0 | 3.8 |
| අනෙකුත් | 3.3 | 3.1 | 4.7 | 5.3 | 4.8 | 8.5 | 2.4 | 2.3 | 3.4 |
| ආර්ථික වශයෙන් අක්‍රිය සියල්ලන් | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

බහුතරයක් එලෙස ආර්ථික වශයෙන් අක්‍රිය වීමට හේතුව වන්නේ අධ්‍යාපන කටයුතුවල නියැළීමයි. සියයට 65 ක් වන ආර්ථික වශයෙන් අක්‍රිය කාන්තාවන්ගෙන් බහුතරය ගෘහස්ථ වගකීම් දරයි (සංඛ්‍යා සටහන වි.ස. 5.3). මේ සම්බන්ධයෙන් වන විමතිය දනවන කරුණ වන්නේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සහ පුරුෂ දෙපිරිසෙහිම අධ්‍යාපන මට්ටම එක හා සමාන වීමයි. විස්තීරණ පවුලෙහි සිට න්‍යෂ්ටික පවුල දක්වා පවුල් ව්‍යුහයෙහි සිදු වූ සංක්‍රමණයත් සමග පසුගිය වසර කිහිපය පුරා ගෘහස්ථ වගකීම් දැරීම වෙනුවෙන් කාන්තාවන් ශ්‍රම බලකායෙන් ඉවත් වීමේ ප්‍රවණතාවක් දැකගත හැකිය. විස්තීරණය වූ පවුලක ගෘහස්ථ වගකීම් විශේෂයෙන්ම, වැඩිහිටියන්ගේ වැඩි සහයෝගය සහිතව සාමාජිකයන් අතර බෙදී යෑමේ නැඹුරුවක් පවතී. න්‍යෂ්ටික එනම්, දෙමාපියන් සහ දරුවන්ගෙන් පමණක් සමන්විත පවුල්වලට එවැනි උපකාරයක් නොලැබෙන අතර ඔවුන්ගේ ගෘහස්ථ වගකීම් ඔවුන් විසින්ම කළමනාකරණය කර ගත යුතු වේ.

### ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය අඩු වීමට සහ ස්ත්‍රී සේවා වියුක්තිය ඉහළ යෑමට හේතු

කාන්තාවන් ශ්‍රම බලකායෙන් ඉවත් වීමට තීරණය කිරීමට හෝ ඔවුන්ට සේවයෙහි යෙදීම අපහසු වීමට බලපාන ප්‍රධාන හේතු කිහිපයකි. ගෘහස්ථ වගකීම්වල නිරතවීම, විශේෂයෙන්ම දරුවන් රැකබලා ගැනීම, ආරක්ෂාකාරී නේවාසික පහසුකම් හා රාජකාරි ස්ථානයට යෑමට ඊමට ප්‍රවාහන පහසුකම් නොමැති වීම, රාජකාරි කාලසීමාවන්ට අනුගත වීම අපහසු වීම සහ තාවකාලිකව සේවයෙන් ඉවත් වූ පසු නැවත රැකියාවක් සොයාගත නොහැකි වීම ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය අඩු මට්ටමක පැවතීම සඳහා බලපාන ප්‍රධාන හේතු වශයෙන් හඳුනාගත

හැකිය. පුරුෂයන් ඉපැයීම් කටයුතුවල යෙදෙන අතර කාන්තාවන් ගෘහස්ථ වගකීම් දැරිය යුතු බවට සමාජ සම්මතයක් ද රට තුළ පවතී. මෙම සම්ප්‍රදායික හැඟීම කාන්තාවන්ට ආර්ථික නිදහස ලබා ගැනීමට ඇති අවස්ථාවලට බාධා පමුණුවයි. අධ්‍යාපන මට්ටම මෙන්ම ආදායම් මට්ටම්[4] අනුව ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ඉංග්‍රීසි “යූ” (U) අක්ෂරයේ හැඩය ගන්නා බව හඳුනාගෙන ඇත (World Bank, 2013). එමගින් පැහැදිලි කරනුයේ මධ්‍යම මට්ටමේ අධ්‍යාපනයක් ලද හෝ මධ්‍යම මට්ටමේ ආදායමක් සහිත කුටුම්බවල වෙසෙන කාන්තාවන් ශ්‍රම බලකායෙන් ඉවත්ව ගෘහස්ථ වගකීම් දැරීමට තීරණය කිරීමේ නැඹුරුවක් ඇති බවයි. දැරිය හැකි පිරිවැයකට, ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ, දරුවන් රැකබලා ගැනීමේ සේවා නොතිබීම හේතුවෙන් බොහෝ කාන්තාවන් ඔවුන්ගේ රැකියාවලින් ඉවත් වන බව ශ්‍රී ලංකාවේ පෙර පාසල් දරුවන් සිටින කුටුම්බවල ශ්‍රම සැපයුම පිළිබඳ ආර්ථික තොරතුරු මගින් විස්තර කර තිබේ. මෙම තත්ත්වය උගත් මව්වරුන් අතර වඩාත් ප්‍රකටය (Premarane, 2011). අධ්‍යාපනය පොදු භාණ්ඩයක් වන රටක, ගැහැණු දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන මහජන මුදල් මගින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන බව මෙමගින් පෙන්නුම් කරන බැවින් මෙය විමසා බැලිය යුතු කරුණක් වේ. ශ්‍රම සංචලනය සැලකූ විට, වඩාත් වැඩි රැකියා අවස්ථා සපයන ප්‍රදේශ කරා යෑම පුරුෂයන්ට වඩා කාන්තාවන්ට අපහසුය. ඉහළ අධ්‍යාපනික මට්ටම් කරා ළඟා වීමත් සමග කාන්තාවෝ කර්මාන්ත සහ සේවා අංශවල රැකියා අපේක්ෂා කරති. මෙවැනි රැකියා අවස්ථා බහුල වශයෙන්ම පවතින්නේ ග්‍රාමීය කාන්තාවන්ට පිවිසීමට අපහසු නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කොටගෙනය. සේවා යෝජකයන්ගේ පාර්ශ්වයෙන් රැකියා සහ ආදායම් ඉපැයීමේ අවස්ථා ලබාදීමේ දී ස්ත්‍රී පුරුෂ බව අනුව අසමානතා දැකිය හැකි බව ද නිරීක්ෂණය කර තිබේ (World Bank, 2013). මෙය ශ්‍රම බලකාය වෙත කාන්තාවන් ආකර්ෂණය කර ගැනීමට බාධාවක්ව පවතී.

**ඉදිරි ක්‍රියාමාර්ග**

ශ්‍රම බලකාය වෙත වැඩිපුර කාන්තාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා තවදුරටත් ප්‍රමාද නොවී ප්‍රතිපත්තිමය සංවාදයක් සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇරඹීම අවශ්‍ය වේ. අර්ධකාලීන රැකියා සඳහා ඉඩකඩ සැලසෙන පරිදි කම්කරු නීති ලිහිල් කිරීම, නම්‍යශීලී සේවා කාල හඳුන්වාදීම, නිවසේ සිට රැකියා කිරීමේ විකල්ප හා ස්වයංරැකියා ප්‍රචලිත කිරීම, දරුවන් රැකබලා ගැනීමේ පහසුකම් ක්‍රමවත් කිරීම සහ තාවකාලිකව සේවයෙන් ඉවත්ව සිට නැවතත් ශ්‍රම බලකායට ඇතුළුවීමට කැමති කාන්තාවන් සඳහා අවශ්‍ය කුසලතා යළි ලබා දීම හා නැවත පුහුණු කිරීම, ශ්‍රම බලකායට වැඩිපුර කාන්තාවන් ඇතුළු වීම ධෛර්යවත් කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග කිහිපයකි. ව්‍යාපාරික ආයතනවල ක්‍රියාකාරකම් ප්‍රධාන නගර ආශ්‍රිතව සංකේන්ද්‍රණය කොට තැබීමට වඩා ප්‍රාදේශීයව ව්‍යාප්ත කිරීමට උනන්දු කිරීම හරහා කාන්තාවන්ට තමන් පදිංචි ප්‍රදේශයෙහි රැකියා අවස්ථා සැපයීම මගින් ඔවුන්ට සේවයෙහි යෙදීමට ඇති බාධා ලිහිල් වනු ඇත. තිරසාර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට පමණක් නොව කාන්තාවන් සවිබලගන්වමින් ආර්ථික වර්ධනය සඳහා ඔවුන්ගේ සහභාගිත්වය සහතික කර ගැනීමට, ජනගහනය වයස්ගත වීමේ අභියෝගය ජය ගැනීමට, ගැහැණු දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දරන ජාතික ආයෝජනයෙහි ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමට මෙන්ම නැගී එන කර්මාන්තවල ශ්‍රම ඉල්ලුම සපයා දීමට කාන්තා ශ්‍රමය වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම වැදගත් වේ.

මූලාශ්‍ර :

1. *Getting in and Staying in: Increasing women's labour force participation in Sri Lanka*, World Bank Group, (2013)

2. *Low Female Labor-Force Participation in Sri Lanka: Contributory Factors, Challenges and Policy Implications*, World Bank Group, (2013)

3. Premaratne, S.P.,(2011), *Household Labour Supply in Sri Lanka for Urban Young Couple with Pre-School Children*, South Asia Economic Journal, I2(2), 323-338

4. *Sri Lanka Demographic Transition Facing the Challenges of an Aging Population with Few Resources*, World Bank Group, (2012)

5. Teignier, M., and Cuberes, D.,(2014) *Aggregate Costs of Gender Gaps in the Labor Market: A Quantitative Estimate*, UB Economics Working Papers E14/308

6. De Silva, I., (2012) *The Age Structure Transition and the Demographic Dividend: An Opportunity for Rapid Economic Take-off in Sri Lanka*, Sri Lanka Journal of Advanced Social Studies, 2,1

4 ඒක පුද්ගල කුටුම්බ පරිභෝජන වියදම් මගින් මනිනු ලැබේ.

**පෙර වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙහිම සේවා නියුක්ති අවස්ථා ඉහළ ගියේය.** එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම සේවා නියුක්ති කාණ්ඩවල සේවා නියුක්ත පුද්ගල සංඛ්‍යාව මෙන්ම දායකත්වය ද ඉහළ ගියේය. කර්මාන්ත සහ සේවා අංශවල රැකියා අවස්ථා වර්ධනය වීම මෙම ඉහළ යෑමට හේතු වූ අතර රාජ්‍ය සහ පෞද්ගලික අංශවල කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා පහළ ගියේය. කෙසේ වුවද, සේවා යෝජකයන්, ස්වයං රැකියාවල නියුතුවූවන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් යන කාණ්ඩවල සේවා නියුක්ත පුද්ගල සංඛ්‍යාව මෙන්ම සමස්ත සේවා නියුක්තියට දක්වන දායකත්වය ද පහළ ගියේය. කර්මාන්ත සහ සේවා අංශවල වෘත්තීන්හි මෙම පහළ යෑම් ප්‍රධාන වශයෙන් දක්නට ලැබිණි.

**4.11 සංඛ්‍යා සටහන** රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය (අ)

ප්‍රතිශතය

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයන් | පෞද්ගලික අංශයේ සේවකයන් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතුවූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයන් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2013 | 15.1 | 40.6 | 3.0 | 32.2 | 9.1 | 100.0 |
| **2014 (ආ)** | **15.3** | **41.1** | **2.8** | **31.9** | **8.9** | **100.0** |
| පළමු කාර්තුව | 15.7 | 40.9 | 3.1 | 31.6 | 8.7 | 100.0 |
| දෙවන කාර්තුව | 15.7 | 41.0 | 2.6 | 31.8 | 8.9 | 100.0 |
| තෙවන කාර්තුව | 14.7 | 40.5 | 3.1 | 32.3 | 9.4 | 100.0 |
| සිව්වන කාර්තුව | 15.3 | 41.9 | 2.3 | 31.8 | 8.6 | 100.0 |

(අ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණයට අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2013 වසරේ පැවති 1,289,151 හි සිට 2014 වසරේ දී 1,330,456 දක්වා සියයට 3.2 කින් වර්ධනය විය. රාජ්‍ය අංශයේ ශුද්ධ බඳවා ගැනීම් ඉහළ යෑම මෙම වර්ධනය සඳහා හේතු විය. ඒ අනුව සමස්ත රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි සිදු වූ මුළු වැඩිවීමෙන් සියයට 84 කට වඩා වැඩි ප්‍රමාණයක් රාජ්‍ය අංශයෙන් වාර්තා වූ අතර, පළාත් සභා සඳහා සංවර්ධන නිලධාරීන් සහ ගුරුවරුන් යන කාණ්ඩවල ශුද්ධ බඳවා ගැනීම් මේ සඳහා විශේෂයෙන්ම හේතු විය. ඉහත ඉහළ යෑම සඳහා පළාත් සභා සියයට 39 කින් පමණ දායක විය. තෘතීයික සහ ප්‍රාථමික මට්ටම්වල ස්ථිර පදනම මත සේවා නියුක්තික සංඛ්‍යාවෙහි සැලකිය යුතු ඉහළ යෑමක් සිදු විය. මේ අතර, ත්‍රිවිධ හමුදාව සහ පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවල සේවා නියුක්තිකයන් සංඛ්‍යාව 6,000 කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. සමස්ත රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙන් සියයට 19.7 ක් වන අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2014 වසරේ දී සියයට 2.5 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. අර්ධ රාජ්‍ය අංශය තුළ සේවා නියුක්ත සංඛ්‍යාවේ විශාලතම ඉහළ යෑම වාර්තා කරනු ලැබුවේ ද්විතීයික මට්ටම විසිනි.

**4.12 සංඛ්‍යා සටහන** රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

| අංශය | 2012 | 2013 (අ) | 2014 (ආ) | ප්‍රතිශත වෙනස 2013/2012 (අ) | ප්‍රතිශත වෙනස 2014/2013 (ආ) |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ඇ) | 993,912 | 1,033,850 | 1,068,773 | 4.0 | 3.4 |
| අර්ධ රාජ්‍ය (ඈ) | 254,728 | 255,301 | 261,683 | 0.2 | 2.5 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,248,640** | **1,289,151** | **1,330,456** | **3.2** | **3.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන හා පළාත් සභා
(ඈ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතිකය 2013 වසරේ වාර්තා කළ සියයට 4.4 හි සිට 2014 වසරේ දී සියයට 4.3 දක්වා පහළ වැටුණු බව කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය මගින් හෙළි විය. සේවා නියුක්ත සංඛ්‍යාව වැඩි වී ඇති අතර සේවා වියුක්ත සංඛ්‍යාව අඩු වී ඇති හෙයින් මෙම සේවා වියුක්ති අනුපාතිකයේ අඩු වීම, ආර්ථිකයේ අංශ ගණනාවක සිදු වූ වර්ධනය හේතුවෙන් රැකියා උත්පාදනයේ ඉහළ යෑමක් නිසා සිදු වූ බව පැහැදිලි වේ. මෙම කාලය තුළ සේවා නියුක්ත පුද්ගල සංඛ්‍යාව සියයට 0.1 කින් ඉහළ ගිය අතර සේවා


**4.13 සංඛ්‍යා සටහන** සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) (අ)

| ශීර්ෂය | 2013 | 2014 (ආ) පළමු කාර්තුව | 2014 (ආ) දෙවන කාර්තුව | 2014 (ආ) තෙවන කාර්තුව | 2014 (ආ) සිව්වන කාර්තුව | 2014 (ආ) වාර්ෂික |
|---|---|---|---|---|---|---|
| **සමස්ත** | **4.4** | **4.1** | **4.5** | **4.2** | **4.4** | **4.3** |
| **ස්ත්‍රී පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 3.2 | 3.0 | 3.4 | 3.3 | 2.9 | 3.2 |
| ස්ත්‍රී | 6.6 | 6.1 | 6.7 | 6.0 | 7.2 | 6.5 |
| **අධ්‍යාපන මට්ටම අනුව** | | | | | | |
| 4 ශ්‍රේණිය/5 වසර සහ ඊට පහළ | ... | ... | ... | ... | ... | ... |
| 5-9 ශ්‍රේණිය/6-10 වසර | 3.4 | 3.1 | 3.6 | 3.8 | 3.0 | 3.4 |
| අ.පො.ස. (සා.පෙ.) | 5.9 | 6.6 | 5.8 | 5.1 | 6.2 | 5.9 |
| අ.පො.ස. (උ.පෙ.) සහ ඊට ඉහළ | 8.6 | 6.9 | 8.7 | 7.9 | 8.8 | 8.1 |
| **වයස් කාණ්ඩ අනුව** | | | | | | |
| 15-19 | 18.7 | 21.1 | 21.8 | 20.2 | 22.8 | 21.5 |
| 20-24 | 19.2 | 19.1 | 18.8 | 20.8 | 21.2 | 20.0 |
| 25-29 | 7.5 | 8.6 | 9.4 | 8.1 | 6.9 | 8.3 |
| 30-39 | 2.7 | 2.4 | 3.1 | 2.3 | 2.9 | 2.7 |
| 40 සහ ඊට ඉහළ | 1.0 | 0.9 | 0.9 | 1.0 | 0.9 | 0.9 |

(අ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.2 රූප සටහන** **ශ්‍රම බලකායේ සහ සේවා වියුක්තියේ ප්‍රවණතා (2010-2014)**




සටහන : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2011 සිව්වන සහ 2012 පළමුවන කාර්තු සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණ පවත්වා නොමැත. 2011 වසර දක්වා කුටුම්බ ජනගහනයෙන්, වයස අවු.10 සහ ඊට වැඩි කාණ්ඩය ද 2012 වසරෙන් පසු වයස අවු.15 සහ ඊට වැඩි කාණ්ඩය ද නියෝජනය වේ.

වියුක්ත පුද්ගල සංඛ්‍යාව සියයට 1.0 කින් පහළ ගියේය. ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2013 වසරේ පැවති සියයට 6.6 හි සිට 2014 වසරේ දී සියයට 6.5 දක්වා පහළ වැටුණු අතර, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය සියයට 3.2 හි නොවෙනස්ව පැවතිණි.

**වයස් කාණ්ඩ අනුව සැලකූ විට වයස අවුරුදු 30 ට අඩු කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතිකය 2013 වසර සමග සැසඳීමේ දී 2014 වසරේ දී ඉහළ ගියේය.** මෙම කාලපරිච්ඡේදය තුළ දී, අවුරුදු 15 - 19 සහ අවුරුදු 20 - 24 යන වයස් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික පිළිවෙළින් සියයට 21.5 සහ සියයට 20.0 වැනි ඉහළ අගයන් ලෙස වාර්තා වූ අතර මෙමගින් රටෙහි තරුණ කාණ්ඩය අතර ඉහළ සේවා වියුක්ති මට්ටමක් පවතින බව පෙන්නුම් කෙරේ. තරුණ කොටස්වල වැඩෙහි යෙදවිය හැකි ඵලදායි කාලය ඌන භාවිතය, තරුණ පිරිස අතර සමාජයීය අසහනය, ආර්ථික ඵලදායිතාව අඩු වීමට සහ දීර්ඝකාලීනව ශ්‍රම කුසලතා අඩු කිරීමට හේතු වන අතර එය ගෝලීය ප්‍රවණතාවලට අනුගතව ආර්ථිකයෙහි ශීඝ්‍රව සිදුවන වෙනස්වීම්වලට සරිලන පරිදි සේවා සැපයීමට ශ්‍රම බලකාය අපොහොසත් වීමට හේතු වනු ඇත. එහෙයින් මෙම ගැටලුව ඉතා ඉක්මණින් සහ ගැඹුරින් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ අවුරුදු 40 හා ඊට වැඩි වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය පහළ ගිය අතර, අවුරුදු 30-39 වයස් කාණ්ඩයෙහි සේවා වියුක්ති අනුපාතිකය නොවෙනස්ව පැවතිණි.

**අ.පො.ස.(උ.පෙළ) සහ ඊට ඉහළ සුදුසුකම් සහිත කාණ්ඩය හැරුණු විට අධ්‍යාපන මට්ටම අනුව අනෙකුත් සියලුම කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික වසර තුළ නොවෙනස්ව පැවතිණි.** අ.පො.ස.(උ.පෙළ) සහ ඊට ඉහළ සුදුසුකම් සහිත කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2013 වසරේ පැවති සියයට 8.6 හි සිට 2014 වසරේ දී සියයට 8.1 දක්වා පහළ වැටිණි. අදාළ කාලය තුළ අ.පො.ස. (සා.පෙළ) සමත් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය සියයට 5.9 ක් වූ අතර, අඩුතම සේවා වියුක්ති අනුපාතිකය වූ සියයට 3.4, 6 - 10 ශ්‍රේණිය සමත් කාණ්ඩය විසින් වාර්තා කරන ලදී. ඉහළ මට්ටමේ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන්ට සේවා නියුක්ති අවස්ථාවක් සොයා ගැනීම අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන්ට වඩා අපහසු බව මෙම සේවා වියුක්ති අනුපාතික මගින් හෙළි වේ. ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන ලද මහජන මුදල්වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන බව මෙමගින් තවදුරටත් පෙන්නුම් කෙරේ. නිපුණතා සහ අපේක්ෂා අතර පවතින නොගැලපීම මෙම ගැටලුව සඳහා ප්‍රධාන හේතුව බව බොහෝ සේවා යෝජකයන් විසින් හඳුනා ගනු ලැබ ඇත. රටෙහි අධ්‍යාපන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කළ යුතු අතර එය කවරාකාරයේ හෝ ශ්‍රමිකයකු බිහි නොකොට නිසි කුසලතා, ආත්ම විශ්වාසය සහ නිසි ආකල්ප සහිත සේවයෙහි යෙදවිය හැකි ශ්‍රම බලකායක් සකසමින් රටෙහි ආර්ථිකය සඳහා ඵලදායි දායකත්වයක් ලබාදීමට ගුණාත්මක ලෙස බලපානු ඇත.

## විදේශ සේවා නියුක්තිය

**පසුගිය කාලය පුරා පැවති විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සමස්ත සංඛ්‍යාව ඉහළ යාමේ ප්‍රවණතාව 2014 වසරේ දී ද අඛණ්ඩව පැවතිණි.** ඒ අනුව, 2013 වසරේ දී 293,218 ක් වූ මුළු විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව 2014 වසරේ දී 300,413 දක්වා සියයට 2.5 කින් වැඩි විය. පුරුෂ සංක්‍රමිකයන්ගේ ඉහළ යෑම මේ සඳහා මුළුමනින් ම හේතු විය. 2014 වසරේ දී ස්ත්‍රී පිටත්ව යෑම්වල වාර්තා වූ 7,544 ක මුළු අඩු වීම අභිබවා යමින් රැකියා සඳහා පුරුෂ පිටත්වීම් 14,739 කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් කෙරෙහි පුරුෂ දායකත්වය පෙර වසරේ පැවති සියයට 59.7 හි සිට 2014 වසරේ දී සියයට 63.2 දක්වා ඉහළ ගියේය. තාක්ෂණික නිපුණතා වර්ධනය තුළින් පුරුෂ සේවකයන්, පුහුණු ශ්‍රමිකයන් ලෙස සංක්‍රමණය වීම ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ගනු ලැබූ නොයෙක් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ඵලදායි බව මෙයින් පිළිබිඹු විය. සියලුම වයස් කාණ්ඩවල පුරුෂ

**4.14 සංඛ්‍යා සටහන**

**විදේශ රැකියා සඳහා පිටත්ව යාම්**

| විදේශ සේවා නියුක්තිය | 2012 | | 2013 (අ) | | 2014 (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු විදේශ රැකියා සංඛ්‍යාව | **282,447** | **100.0** | **293,218** | **100.0** | **300,413** | **100.0** |
| මූලයන් අනුව | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 175,169 | 62.0 | 180,463 | 61.6 | 177,012 | 58.9 |
| වෙනත් | 107,278 | 38.0 | 112,755 | 38.4 | 123,401 | 41.1 |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 144,135 | 51.0 | 175,185 | 59.7 | 189,924 | 63.2 |
| ස්ත්‍රී | 138,312 | 49.0 | 118,033 | 40.3 | 110,489 | 36.8 |
| ශ්‍රම කාණ්ඩය අනුව | | | | | | |
| වෘත්තීය | 4,448 | 1.6 | 5,151 | 1.8 | 5,340 | 1.8 |
| මධ්‍යම | 9,280 | 3.3 | 16,510 | 5.6 | 20,749 | 6.9 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 16,184 | 5.7 | 26,561 | 9.1 | 29,237 | 9.7 |
| පුහුණු ශ්‍රමික | 67,150 | 23.8 | 73,707 | 25.1 | 73,039 | 24.3 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 3,467 | 1.2 | 3,412 | 1.2 | 3,972 | 1.3 |
| නුපුහුණු ශ්‍රමික | 62,907 | 22.3 | 70,977 | 24.2 | 79,415 | 26.4 |
| ගෘහ සේවිකා | 119,011 | 42.1 | 96,900 | 33.0 | 88,661 | 29.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

සංක්‍රමිකයන් තුළ මෙම ප්‍රවණතාව පැහැදිලිව දැකිය හැකි විය. මේ අතර, වයස අවුරුදු 45 - 49 සහ අවුරුදු 50 හෝ ඊට වැඩි කාණ්ඩ හැරුණු විට අනෙකුත් සෑම වයස් කාණ්ඩයකම ස්ත්‍රී පිටත්ව යෑම් සංඛ්‍යාවෙහි පහළ යෑමක් දක්නට ලැබිණි.

**කුසලතා අනුව සංක්‍රමික සේවා නියුක්තිය සැලකූ විට, වෘත්තීයමය, මධ්‍යම මට්ටම, ලිපිකරු ආශ්‍රිත රැකියා, අර්ධ පුහුණු ශ්‍රමික සහ නුපුහුණු ශ්‍රමික යන රැකියා කාණ්ඩවල ඉහළ යෑමක් 2014 වසරේ දී දක්නට ලැබිණි.** මේ අතර, 2014 වසරේ දී පිටත්ව යෑම්වල විශාලතම අඩුවීම වූ 8,239, සියයට 8.5 කින් පහළ වැටුණු ගෘහ සේවිකා කාණ්ඩය විසින් වාර්තා කරන ලදී. ඉන්පසු විශාලතම අඩු වීම පුහුණු ශ්‍රමික කාණ්ඩයෙන් වාර්තා විය. 2014 වසරේ සමස්ත සංක්‍රමික ශ්‍රමිකයන්ගෙන් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් පුහුණු ශ්‍රමිකයන්, නුපුහුණු ශ්‍රමිකයන් සහ ගෘහ සේවිකාවන් විය. වෘත්තීමය හා පුහුණු කාණ්ඩ යටතේ වැඩිපුර විදේශ රැකියා පහසුකම් සලසමින්, පුහුණු ශ්‍රම සංක්‍රමණ දියුණු කිරීමට සහ ගෘහ සේවිකා හා නුපුහුණු කාණ්ඩ අධෛර්යවත් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මෙමගින් තීව්‍ර කර දක්වයි.

**2014 වසරේ දී මැදපෙරදිග රටවල් වෙත පිටත්ව ගිය සංඛ්‍යාව 279,952 දක්වා සියයට 1.7 කින් සුළු ලෙස ඉහළ ගියේය.** විශේෂයෙන්ම ලිපිකරු, මධ්‍යම මට්ටම සහ නුපුහුණු කාණ්ඩවල ප්‍රශංසනීය වර්ධනයක් පෙන්නුම් කරමින් මැදපෙරදිග රටවල් වෙත ගිය පුරුෂ සංක්‍රමික සංඛ්‍යාව ඉහළ ගියේය. මේ සමගම පුරුෂ දායකත්වය ද සියයට 62.3 දක්වා වැඩි විය. කටාර් රාජ්‍යයෙන් පුරුෂ ශ්‍රමිකයන් සඳහා වැඩි ඉල්ලුමක් තිබීම මේ සඳහා හේතු විය. මෙයට ප්‍රතිවිරුද්ධව යමින් 2014 වසරේ දී මැදපෙරදිග රටවලට ගෘහ සේවිකාවන් ලෙස පිටත්ව ගිය සංඛ්‍යාව එහි මෑතකාලීනව දක්නට ලැබුණු පහළ යෑමේ නැඹුරුව අඛණ්ඩව පවත්වා ගනිමින් තවදුරටත් 8,148 කින් පහළ ගියේය. ස්ත්‍රී සංක්‍රමික ශ්‍රමිකයන්ගේ දරුවන්හට නිසි රැකවරණයක් නොලැබීම හේතුවෙන් ඔවුන් විසින් ඇරිය යුතු මනෝ සමාජ පිරිවැය අවම කිරීමේ අරමුණෙන් පවුල් පසුබිම් වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම මේ සඳහා හේතු විය. විශේෂයෙන්ම සෞදි අරාබිය, කුවේට් සහ කටාර් යන රටවල් වෙත ගෘහ සේවිකාවන් ලෙස පිටත්ව යෑමේ පැහැදිලි අඩුවීමක් දක්නට ලැබිණි. මීට වෙනස්ව යමින් සෞදි අරාබිය වෙත නුපුහුණු රැකියා සඳහා පිටත්ව ගිය ස්ත්‍රී ශ්‍රමිකයන් සංඛ්‍යාවෙහි

**4.15 සංඛ්‍යා සටහන**

**ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2013 (අ) | | 2014 (ආ) | | වෙනස (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය | සංඛ්‍යාව | දායකත්වය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සෞදි අරාබියාව | 80,887 | 27.6 | 80,539 | 26.8 | -348 | -0.4 |
| කටාර් | 80,724 | 27.5 | 84,571 | 28.2 | 3,847 | 4.8 |
| කුවේට් | 27,027 | 9.2 | 25,896 | 8.6 | -1,131 | -4.2 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 48,502 | 16.6 | 50,192 | 16.7 | 1,690 | 3.5 |
| වෙනත් | 56,078 | 19.1 | 59,215 | 19.7 | 3,137 | 5.6 |
| **එකතුව** | **293,218** | **100.0** | **300,413** | **100.0** | **7,195** | **2.5** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

වර්ධනයක් දක්නට ලැබිණි. මෙම වර්ධනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ගෘහ සේවිකාවන් හැර සමස්ත පිටත්වයාම්වල සියයට 8 ක පමණ සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා විය.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 2014 වසරේ දී විදේශ රැකියා නියෝජිත ආයතන ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම සඳහා නව බලපත්‍ර 101 ක් නිකුත් කළ අතර බලපත්‍ර 998 ක් අලුත් කරන ලදී.** කෙසේ වුවද, විදේශ සේවා නියුක්ති කාර්යාංශ සංඛ්‍යා ලේඛනවලින් දැක්වෙන පරිදි බලපත්‍රලාභී නියෝජිත ආයතන හරහා විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් පෙර වසරේ පැවති සියයට 61.6 හි සිට 2014 වසරේ දී සියයට 58.9 දක්වා පහළ ගියේය. ඒ අනුව, අනෙකුත් මූලාශ්‍ර හරහා පිටත්ව යෑම්වල 2014 වසරේ දී ඉහළ යෑමක් වාර්තා විය.

**විදේශ සේවා නියුක්තිය තුළ ශ්‍රී ලාංකික සංක්‍රමික ශ්‍රමිකයන්ගේ ගරුත්වය, සුරක්ෂිත බව හා සාධාරණත්වය විධිමත් කිරීමට සහ තහවුරු කිරීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් වැඩසටහන් ගණනාවක් ආරම්භ කොට තිබේ.** ඒ අනුව විදේශ රැකියා නියෝජිත ආයතන ධෛර්යවත් කිරීමේ අරමුණෙන් සලාක ක්‍රමය අවලංගු කරන ලද අතර, යහපාලනය වර්ධනය කිරීම සහ සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම යන තේමාව යටතේ රැකියා නියෝජිත ආයතන ශ්‍රේණිගත කිරීම 2014 වසරේ දී ආරම්භ කරන ලදී. බඳවා ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමේ අරමුණ සහිතව ජාලගත බඳවා ගැනීම් පද්ධතිය වැඩි රටවල් සංඛ්‍යාවක් ආවරණය වන පරිදි තවදුරටත් සවිමත් කරවන ලදී. මේ අතර, සංක්‍රමික ශ්‍රමිකයන්ගේ සුභසාධනය සුරැකීම සහ එම කලාපයේ විදේශ සේවා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන මැදපෙරදිග රටවල සේවය කරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ කාර්යමණ්ඩල ශ්‍රමික සංඛ්‍යාව ඉහළ නංවන ලදී. තවද, 2014 වසරේ දී රටවිරු පියස නිවාස ණය වැඩසටහන මගින් ලබාදුන් ණය සංඛ්‍යාවෙහි සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබිණි.

## කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳ පොළ ප්‍රතිසංස්කරණ

**පෞද්ගලික අංශයේ සමස්ත වැඩ වර්ජන සංඛ්‍යාව, වැඩ වර්ජන සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාව සහ එම වර්ජන හේතුවෙන් අහිමි වූ මුළු මිනිස් දින ගණන 2013 වසර සමග සැසඳූ විට 2014 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය.** 2014 වසරේ දී වැවිලි අංශයෙහි සේවක වර්ජන සංඛ්‍යාව ඉහළ ගිය ද අනෙකුත් අංශවල වාර්තා වූ සේවක වර්ජන සංඛ්‍යාව පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයේ කර්මාන්තවල මුළු සේවක වර්ජන සංඛ්‍යාව 2013 වසරේ පැවති 42 හි සිට 2014 වසරේ දී 38 දක්වා අඩු විය. තවද, මෙයින් බොහොමයක් සංකේත වර්ජන වූ අතර අදාළ කළමනාකාරිත්ව සමග කෙටිකාලීනව පැවතුණු මත ගැටලු මේ සඳහා හේතු විය. එහෙයින් ඉන් ඇති වූ අහිතකර බලපෑම අවම විය. මේ අතර, පෞද්ගලික අංශයේ වැඩ වර්ජනවලට සහභාගි වූ සේවක සංඛ්‍යාව 2013 වසර සමග සැසඳූ විට 2014 වසරේ දී සියයට 42.0 කින් සැලකිය යුතු ලෙස අඩු විය. මෙය පෞද්ගලික අංශයේ කර්මාන්තවල අහිමි වූ

**4.16 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ (අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2011 | 19 | 7,232 | 23,513 | 8 | 3,807 | 15,673 | 27 | 11,039 | 39,186 |
| 2012 | 14 | 4,278 | 25,043 | 20 | 5,626 | 10,774 | 34 | 9,904 | 35,817 |
| **2013** | **21** | **5,031** | **41,669** | **21** | **6,088** | **38,754** | **42** | **11,119** | **80,423** |
| පළමු කාර්තුව | 4 | 416 | 1,046 | 7 | 2,505 | 21,381 | 11 | 2,921 | 22,427 |
| දෙවන කාර්තුව | 7 | 2,436 | 29,112 | 5 | 1,893 | 7,537 | 12 | 4,329 | 36,649 |
| තෙවන කාර්තුව | 5 | 1,490 | 9,134 | 2 | 498 | 3,208 | 7 | 1,988 | 12,342 |
| සිව්වන කාර්තුව | 5 | 689 | 2,377 | 7 | 1,192 | 6,628 | 12 | 1,881 | 9,005 |
| **2014 (ආ)** | **31** | **4,833** | **29,165** | **7** | **1,618** | **8,158** | **38** | **6,451** | **37,323** |
| පළමු කාර්තුව | 12 | 1,582 | 3,831 | - | - | - | 12 | 1,582 | 3,831 |
| දෙවන කාර්තුව | 9 | 1,121 | 5,275 | 4 | 1,360 | 6,712 | 13 | 2,481 | 11,987 |
| තෙවන කාර්තුව | 5 | 830 | 8,820 | 2 | 128 | 1,186 | 7 | 958 | 10,006 |
| සිව්වන කාර්තුව | 5 | 1,300 | 11,239 | 1 | 130 | 260 | 6 | 1,430 | 11,499 |

(අ) අර්ධ රාජ්‍ය සහ අනෙකුත් පෞද්ගලික ආයතන ඇතුළත් වේ.
(ආ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

මිනිස් දින ගණන 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 53.6 කින් පහළ හෙලීමට හේතු විය. කෙසේ වුවද, වැවිලි අංශයේ අහිමි වූ මිනිස් දින ගණන පෞද්ගලික අංශයේ අනෙකුත් කර්මාන්තවල අහිමි වූ මිනිස් දින ගණනට වඩා වැඩි විය.

**කාර්මික සාමය වැඩි දියුණු කිරීම සඳහා 2014 වසරේ දී කම්කරු දෙපාර්තමේන්තුව විසින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, එම දෙපාර්තමේන්තුව දිස්ත්‍රික්ක කාර්යාල හරහා වැඩබිමෙහි සහයෝගිතාව සහ කාර්මික සාමය ඉහළ නැංවීම සඳහා වන ක්‍රියාකාරකම්වල අඛණ්ඩව නියැළිණි. ඔවුන්ගේ නිත්‍ය සොයාබැලීම් සඳහා වන සංචාරවලට අමතරව වැඩි වශයෙන් ආරවුල් වාර්තා වන ආයතන කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. සේවකයන්ට සහ සේවකයන් හා කළමනාකරණය යන දෙකොටසටම ආදී වශයෙන් වෙන් වෙන්ව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

## ශ්‍රම ඵලදායිතාව

**වැඩෙහි යෙදුණු පැයකට ද.දේ.නි. (2002 වසරේ මිල ගණන් අනුව) මගින් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව[4] 2013 වසරේ වූ පැයකට රු.181.51 සමග සැසඳූ විට 2014 වසරේ දී පැයකට රු.192.55 දක්වා සියයට 6.1 කින් ඉහළ ගියේය.** මෙම වර්ධනය ආර්ථිකයේ අංශ තුනම හරහා ළඟා කර ගැනිණි. ඉහළම ශ්‍රම ඵලදායිතා වර්ධන වේගය වූ සියයට 8.7 කර්මාන්ත අංශයෙන් වාර්තා විය. 2014 වසරේ දී කෘෂි කර්මාන්ත අංශය සියයට 4.3 ක ඵලදායිතා වර්ධනයක් වාර්තා කළ අතර සේවා අංශය සියයට 3.4 ක් වූ සාපේක්ෂව අඩු ඵලදායිතා වර්ධනයක් වාර්තා කළේය.

**කෘෂිකර්මාන්ත අංශය මධ්‍යස්ථ ශ්‍රම ඵලදායිතා වර්ධනයක් වාර්තා කළ ද කර්මාන්ත සහ සේවා අංශවල ශ්‍රම ඵලදායිතා මට්ටම සමග සසඳන විට එය අඩුතම මට්ටම වේ.** කෘෂිකර්මාන්ත අංශයෙහි වැඩෙහි යෙදුණු පැයකට වාර්තා වූ නිමැවුම අනෙකුත් අංශ දෙකෙහි වාර්තා වූ එම අගයන්ගෙන් හරි අඩකටත් වඩා අඩුය. මෙම අංශයෙහි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වැඩිදුර අවධානයක් අවශ්‍ය බව මෙමගින් ඉඟි කෙරේ. රටෙහි සමස්ත සේවකයන්ගෙන් දළ වශයෙන් සියයට 28 ක් පමණ මෙම අංශයෙහි සේවයේ යෙදී සිටින අතර රටෙහි සමස්ත නිමැවුම සඳහා එහි දායකත්වය සියයට 10 ක් පමණක් වීම, ආදායම් බෙදී යෑම සහ සහභාගිත්ව වර්ධනය පිළිබඳ

4 සමස්ත සේවා නියුක්තිය යෙදවුම් මානය ලෙසත් ද.දේ.නිෂ්පාදිතය නිමැවුම් මානය ලෙසත් ගෙන 2013 වසර දක්වා ශ්‍රම ඵලදායිතාව ගණනය කරන ලදී. ජාත්‍යන්තර මග පෙන්වීම්වලට අනුව වැඩෙහි යෙදුණු සමස්ත පැය ගණන 2014 වසරේ සිට ශ්‍රම යෙදවුම් මානය ලෙස භාවිතා කරයි.

**4.17 සංඛ්‍යා සටහන — ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදයිතාව**

| ශීර්ෂය | 2013 | 2014 (අ) |
|---|---|---|
| ස්ථාවර (2002) මිල අනුව ද.දේ.නි. (රුපියල් මිලියන) | **3,266,041** | **3,506,664** |
| කෘෂිකර්මාන්ත | 352,583 | 353,709 |
| කර්මාන්ත | 1,016,886 | 1,132,892 |
| සේවා | 1,896,572 | 2,019,973 |
| ශ්‍රම ඵලදායිතාව, වැඩ කරන ලද පැයක් සඳහා රුපියල් (ආ) | **181.51** | **192.55** |
| කෘෂිකර්මාන්ත | 79.97 | 83.33 |
| කර්මාන්ත | 214.70 | 233.28 |
| සේවා | 214.42 | 221.71 |

(අ) තාවකාලික
(ආ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අසමතුලිතතා ඇති කිරීමට හේතු වන බැවින් මෙය තවදුරටත් වැදගත් වේ. අනෙකුත් අංශ දෙකටම වඩා කෘෂිකාර්මික අංශයෙහි සේවකයන්හට නිෂ්ඵල සේවා පැය ගණනක් ගත කිරීමට සිදු වන බව ද ප්‍රකටය. අහිතකර කාලගුණික තත්ත්ව මත වගා හානි සිදු වූ කාලපරිච්ඡේදවල දී මෙම ප්‍රවණතාව පැහැදිලි ලෙස දැකගත හැකිය. කෘෂිකාර්මික අංශයෙහි නියුතු පුද්ගලයන්ගේ එම නිෂ්ඵල සේවා කාලය ප්‍රයෝජනයට ගෙන ඔවුන්ගේ ජීවනෝපායන් ඉහළ නැංවීම තුළින් ජාතික නිමැවුම වර්ධනය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. මෙම ගැටලුව ජයගැනීම සඳහා රෝග හා අයහපත් කාලගුණයට ප්‍රතිරෝධී බෝග වර්ග සහ වැඩි දියුණු කළ රෝපණ ක්‍රම ප්‍රවර්ධනය කරන අතරම කෘෂිකර්මික අංශයේ සේවකයන්ට නිෂ්ඵල සේවා කාලය තුළ දී වෙනත් ඕනෑම රැකියාවක නිරත වීමට හැකි වන පරිදි ඔවුන්ගේ නිපුණතා පදනම විවිධාංගීකරණය කළ යුතුව ඇත.

**අංශ තුන අතුරෙන් කර්මාන්ත අංශය වසර තුළ ඉහළම මට්ටමේ ශ්‍රම ඵලදායිතාව වාර්තා කළේය.** සේවා අංශයේ ශ්‍රම ඵලදායිතාව අඩු වර්ධනයක් සහිතව වුවද, මධ්‍යස්ථ මට්ටමක පැවැතිණි. කර්මාන්ත සහ සේවා අංශ විසින් මේ වන විට ආර්ථිකය තුළ නව සේවකයන්ගෙන් බහුතරය ආකර්ෂණය කර ගනිමින් සිටින හෙයින් එම අංශවල ඵලදායිතා වර්ධනය තාවකාලිකව ක්ෂය වීමට ඉඩ ඇත. ශ්‍රම පරිභෝජනය හා සම්බන්ධ යහපත් පරිචයන් සමග යාන්ත්‍රීකරණය ඉහළ නැංවීම සහ ඉහළ මට්ටමකින් තාක්ෂණය යොදා ගැනීම මෙවන් ගැටලු ජය ගැනීමට උපකාරී විය හැකිය. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යහපත් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් දිගුකාලීන දැක්මක් සහිතව මෙවැනි ක්‍රියාමාර්ගවලට එළඹිය යුතුව ඇත.

**පෞද්ගලික අංශයේ ඵලදායිතා වර්ධනයට අනුග්‍රහය දැක්වීම සඳහා පරිපාලන ක්‍රියාවලි අතර බාධාවකින් තොරව කාර්ය ගලායෑම පහසු කරමින් රාජ්‍ය අංශයේ ඵලදායිතාව ද ඉහළ නැංවිය යුතුය.** පරිපාලන ක්‍රියාවලිවල අවහිරතා පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය අධෛර්යවත් කරයි. නිසි ලෙස ක්‍රියාත්මක වන රාජ්‍ය අංශයක් සමස්ත ආර්ථිකයෙහි තරගකාරිත්වය ඇති කරමින් ප්‍රශස්ත ප්‍රායෝගික නිදර්ශන සකසන අතර සියලුම අංශවල ඵලදායිතා වර්ධනය සඳහා පහසුකම් සලසයි. එහෙයින්, රෙගුලාසි ලිහිල් කරමින්, පරිපාලන ක්‍රියාවලිවලට අදාළ පාලන රීති සහ සීමා කිරීම් ඉවත් කරමින් රාජ්‍ය අංශයේ සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ආර්ථිකයෙහි සමස්ත ඵලදායිතා ඉහළ නැංවීම සඳහා මූලිකවම ක්‍රියාවට නැගිය යුතුය.